## 2022 නොවැම්බර් මස 10 වන දින පැවති

## විශේෂ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව

**දිනය :-2022.11.10**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ. ව 10.00**

**සහභාගී වූ :-**

01. ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
02. ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
03. ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
04. ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
05. ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
06. ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
07. ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
08. ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
09. ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
10. ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
11. ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
12. ගරු මන්ත්‍රී ඩී.පී. බන්දුලසේන මැතිතුමා ( ශ්‍රී. ල. නි. ප)
13. ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා ( ශ්‍රී.ල නි.ප)
14. ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ( ජ.වි.පෙ)
15. ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා ( ජ.වි.පෙ)
16. ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා (ස්වාධීන කණ්ඩායම)

**දන්වා සහභාගී නොවූ:-**

01. ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ( එ.ජා.ප)

**නොදන්වා සහභාගී නොවූ!:-**

01. ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය (එ.ජා.ප)
02. ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ( එ.ජා.ප)
03. ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය ( එ.ජා.ප)
04. ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය ( එ.ජා.ප)

**නිළධාරීන්:-**

01. ලේකම් ජේ. ඒ. එස්. උදයසිරි මයා
02. විෂය භාර කළමනාකරණ සේවා නිළධාරී කේ. ජී. ඒ සම්මානී මෙය
03. සහකාර ගිණුම් නිළධාරී එස්. එම්. මහරගෙදර මිය

**01.මහ සභාව පිළි ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව විශේෂ මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 02.අයවැය කතාව ගරු සභාපතිතුමා විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කිරීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා

ගරු උප සභාපති තුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලා , තුමියන්ලා, සියලු දෙනාට ම සුභ උදෑසනක් හා සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා.2023 වර්ෂය සඳහා වූ නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ අයවැය ඉදිරිපත් කිරීමේ කථාව ඉදිරිපත් කරමි. මෙම අයවැය ඉදිරිපත් කරන මොහොත වන විට රට ආර්ථිකමය වශයෙන් ඉතා දරුණු ලෙස කඩා වැටීමකට ලක් වී ඇති බව ඔබ ඉතා හොඳින් දන්නා කරුණකි. නමුත් සෘණ ආකල්ප තුල නොසිට ධන ආකල්ප තුල සිට නැ. නු. ප ප්‍රාදේශීය සභා ජනතාවට 2023 වර්ෂය සුභවාදී මගකට ගෙන ඒම සඳහා මෙම අයවැය ඉදිරිපත් කිරීමට මම කටයුතු කර තිබෙනවා

මෙහි දී බුද්ධිමත් හා අවංක මහජන නියෝජිතයින් ලෙස කටයුතු කරමින් ඉතා සුභවාදී ආකල්ප තුල සිට ප්‍රාදේශීය සභාවේ වපසරිය තුල සංවර්ධන යෝජනා ඉදිරිපත් කරමින් මෙම අයවැය සංශෝධන වලට යටත් ව ඒකමතිකව සහා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින අයවැය යෝජනාව ඉදිරිපත් කරමි.

මා විසින් 2021 අයවැය කථාවේ දී ඔබ වෙත ඉදිරිපත් කරන ලද කුඩා නෙළුබැව කඩ සංකීර්ණයේ ගැටලුව විසඳා ලස්සන නගරයක සිරි ය ගෙන ඒමට මම සමත් විය.මෙහි දී එහි ගෞරවය උප සභාපති සරත් ප්‍රේමචන්ද්‍ර මහතාට හා ප්‍රාදේශීය ලේකම් -කේ.පී.චාමින්ද මහතාට ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගැනීමට මම කැමතියි.ඒ වගේ ම කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුත්ත ද 90%ක් නිම කිරීමට හැකියාව ලැබුනා. මේ සම්බන්ධයෙන් LDSP ව්‍යාපෘතියටත් පළාත් පාලන කොමසාරිස් එන්.එච්.ආර්.නිශාන්ත මහතාටත් , නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් එල්.එච්.වී.ඉරෝෂණී මහත්මියටත් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. 2022 අයවැය ඉදිරිපත් කිරීමේ දී මා විසින් යෝජනා කරන ලද, 2021 යෝජිත එහෙත් රැස්කර ගැනීමට නොහැකි වූ ආදායම් උත්පාදිත ව්‍යාපෘති සංවර්ධනය කර නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ උත්පාදිත ආදායම ශක්තිමත් කිරීම කර ගැනීමට නොහැකි වුනා. නමුත් කනගාටුවෙන් වුනත් යමක් කිවයුතුව තිබෙනවා. 2022 මාර්තු මාසය දක්වා කාලයේ දී කොරෝනා වසංගතය තුල රට ආර්ථිකමය වශයෙන් පහළ වැටීමත් සමඟ රට තුල ඇතිවුන අරගලය හා එම අරගලයෙන් අයුතු ප්‍රයෝජන ගැනීම සඳහා ( දේශපාලන වාසි) පක්ෂ, විපක්ෂ විසින් රටක් ගැන නොසිතා විවිධ අවස්ථාවන්වල දී ඇති වී තිබුන පොහොර , තෙල් හා ගෑස් හිඟයක හා භාණ්ඩ මිළ ඉහල යාම පදනම් කර ගෙන රාජ්‍ය බලය ලබා ගැනීමට කටයුතු කිරීමත් සමඟ රටේත් මුළු මහත් සමාජයේත් කඩා වැටීමකට ලක්වුනා. මේ තත්වය ආයතනයක් ලෙස නැ.නු.ප ප්‍රාදේශීය සභාවටත් බලපෑවා. එය රටේ හා අපගේ අභාග්‍යයක් ලෙස දැක්විය හැකිය.

මෙම තත්වය මෙසේ පැවතියත් LDSP ව්‍යාපෘතිය හරහා ලැබුන ප්‍රතිපාදන තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් ඉතාම ඉහල මට්ටමකින් ගෙන යාමට අපි සමත් වුනා. පෙරටු කාර්යාලය මගින් විධිමත් ජනතා සේවයක් ලබාදිය හැකි ලෙස සංවර්ධනය කලා. ආබාධිත අයගේ පහසුව සඳහා අවශ්‍ය පියවර ගත්තා ,කාර්යාලයක් ලෙස ධාරිතා සංවර්ධනය ඉහලින්ම කිරීමටත්, ජනතාවට පහසුකම් සැලසීම හා සංනිවේදනය කිරීමේ තාක්ෂණ මෙවලන් වැඩි දියුණු කිරීමට සමත් වුනා. තොරතුරු හා ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ ජනතා දැනුවත් කිරීමේ තාක්ෂණික මෙවලන් දියුණු කලා. LDSP ව්‍යාපෘතියේ ප්‍රගතියද ලබා දීමේදී මුදල් ප්‍රමාණය ගණනය කලේ අප කාර්යාල කටයුතු හා ජනතා සේවය පිළිබඳ දැක් වූ නිවැරදි ක්‍රියාමාර්ග ගණනය කර ලකුණු දීමේ ක්‍රියාදාමයක් තුලයි. එහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතුරින් නැ.නු.ප ප්‍රාදේශීය සභාව දෙවැනි වුනේ තලාව ප්‍රාදේශීය සභාවට පමණයි. මෙය අප ලැබූ ජයග්‍රහනයකි. ඒ අනුව අපට බිලියන 1.2ක මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. එම ලකුණු ලබාදීමේ තරඟය 2022 වර්ෂයේ ද පැවැත්වීම තුල එයට ද අප සෘජුවම මූණ දුන්නා. එහි දී නැ.නු.ප ප්‍රාදේශීය සභාව වෙත බිලියන 1.66ක මුදලක් ලැබුනා. ඒ අනුව අප ප්‍රාදේශීය සභාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් ඉහළ පෙළේ සිටි. ඒ සම්බන්ධයෙන් මා මගේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වනවා පමණක් නොව එක්ව සතුටු වුනා. ඒ සතුට ඔබටත් හිමිවිය යුතු බව මගේ හැඟීමයි.

තවත් විශේෂ දෙයක් කිව යුතුයි. පසුගිය කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය පදනම් කරගෙන සමහර පළාත් පාලන ආයතන අනියම් සේවකයින්ට ලබා දුන් දින ගණන් පවා කප්පාදු කර තිබෙනවා. ඒත් අපි එසේ නොකර එම සේවකයින් ආරක්ෂා කලා පමණක් නොව අත්‍යවශ්‍ය සේවාවන් ද නොපිරිහෙළා ඉටු කලා. මේ සියල්ල මා ප්‍රකාශ කරන්නේ ඉහමත් සතුටිනි.

කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමය මේ වන විට නිමා වෙමින් තිබෙනවා. ඉදිරි කාලයේ දී ඉන්ධන පිරවුම්හලක් ලබා ගැනීම සඳහා ද පියවර ගෙන තිබෙනවා. මෙම ආර්ථික මධ්‍යස්ථානය පිහිටි ඉඩම විවිධ පාර්ශව විසින් විවිධ පුද්ගලයන්ට ලබා දීමට ගියත් ඒ සියල්ල මඟ හරවා ගෙන සභාවේ අයිතිය බවට

තහවුරු කර ගැනීමට හැකි වී තිබෙනවා. එහි ක්‍රීඩා පිටිය ඉතා වැදගත් භූමි භාගයක් ලෙස ද අද ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය සඳහා වෙන් කර තිබෙනවා. ඒවාගේම පසුගිය 2022 වර්ෂයේ අයවැය තුල යෝජනා කරන ලද සියලු ව්‍යාපෘති නිම කිරීමට අපි සමත් වුනත් 2022 දී ක්‍රියාත්මක කිරීමේදී රටතුළ පැවති අවාසනාවන්ත තත්වය අපට බලපෑවා

ඔබතුමාලා, තුමියන්ලා හොඳින් අවබෝධ කර ගත යුතු වැදගත් දෙයක් මම මෙහි දී සිහිපත් කරන්න කැමතියි. මා සභාපති වූ වසරේ සිට මේ දක්වා කාලයම ඉතා කණගාටුදායක කාලපරිච්ඡේදයක් වීම, නොවීමට මෙම ප්‍රාදේශීය සභාව අනුරාධපුර පළාත් පාලන ආයතන සියල්ලට ම ඉහළින් ගෙන යාමට මට හැකි වනු ඇතැයි මා විශ්වාස කරනවා. මේ අවස්ථාවේ මා විසින් 2023 අයවැය ඉදිරිපත් කරනුයේ නැ.නු.ප.ප්‍රාදේශීය සභාව ඉහළට ඔසවා තැබීමේ අව්‍යාජ චේතනාවෙන් බවත් පවසමින් ඒ සඳහා ඔබ සියළු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරනවා. එසේ නම් මා, 2023 වර්ෂයේ අයවැය විග්‍රහය මෙලෙස මා ආරම්භ කරනවා.

<u>**ආදායම් විග්‍රහය**</u>

1. මුලින් ම ආදායම් ශීර්ෂ 4100 ට අනුව වරිපනම් හා බදු ශීර්ෂය යටතේ 2022 අයවැය සඳහා රුපියල් තිස්හතර ලක්ෂ තිස්හත් දහසක් (3,437,000.00) මුදලක් තක්සේරු කර ඇති අතර 2022.09.30 දිනට එකතු කිරීමට හැකි වූ මුළු ආදායම රුපියල් විසි ලක්ෂ දහසය දහස් හාරසිය එකොළහක් (2,016,411.00) පමණ වේ. ඉදිරි මාස තුන තුල දී රුපියල් දහ හතර ලක්ෂ විසි දහස් පන්සිය අසූ නවයක් (1,420,589.00)එකතු කිරීමට ඉතිරිව තිබෙන නමුත් ඉන් රුපියල් ලක්ෂ පහක් (500,000.00) වරිපනම් වෙනුවෙන් වෙන් කර තිබුනද එහි තක්සේරු කටයුතු සිදු කිරීමට ප්‍රමාද වීම මත මෙම වර්ෂයේ දී වරිපනම් අය කිරීමට හැකියාවක් නොලැබින. ඒ අනුව ඉදිරි මාස තුන තුළ දී අය කිරීමට ඇති ආදායම රුපියල් නවලක්ෂ විසි දහස් පන්සිය අසූ නවයකි. (920,589.00)
   වරිපනම් හා බදු යටතේ ආදායම් විග්‍රහ කිරීමේ දී,
   - ආදායම් **ශීර්ෂ4101 වරිපනම්** යටතේ 2022 වර්ෂයේ රුපියල් ලක්ෂ පහක් (රු.500,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2022 වර්ෂය සඳහා මේ වන තෙක් කිසිදු මුදලක් ආදායම ලෙස රැස් කර ගැනීමට නොහැකි වූ බව දන්වමි. එසේවීමට හේතු ලෙස 2021 වර්ෂයේ වරිපනම් ගැසට් පත්‍රයේ එල කිරීමට යවා තිබුනද එය 2021 වර්ෂයේ දෙසැම්බර් දක්වාම පළ නොවීම හා තක්සේරු කටයුතු සිදු කිරීමට නොහැකි වීම මත ය. මේ වන විට ගෘහ ඒකක පිළිබඳ තොරතුරු රැස් කිරීමේ කාර්යය සිදු කරන බැවින් ඉදිරි වර්ෂයේ දී මෙම ආදායම් රැස් කිරීමට හැකියාව ලැබේ යැයි අපේක්ෂා වෙන් 2023 වර්ෂයේ ද වරිපනම් ලෙස රුපියල් ලක්ෂ පහක් (රු.500,000.00) ඇස්තමේන්තු කර තිබෙනවා
   - **4102 ඉඩම් බදු** ලෙස දක්වා ඇති ආදායම් ශීර්ෂය මෙන් ම මෙම අයවැය ලේඛනයේ 2023 වර්ෂයේ ආදායම් ලෙස සඳහන් නො කරන ලද ආදායම් අප ආයතනයට අදාළ නොවන ඒවා බව දන්වමි.
   - තවද **4103 ආදායම්** ශීර්ෂය යටතේ රුපියල් දහසක (රු. 1000.00) මුදලක් අයවැය ට එකතු කර ඇති අතර 2022 වර්ෂයේ ද ඒ හා සමාන මුදලක් වෙන් කර ඇත. 2022.09.30 වන විට ඉන් රුපියල් තුන්සිය අනූ එකක මුදලක් (රු.391.00)අයවී ඇත.
   - **4107 විනෝද බද්ද - වෙනත්** ශීර්ෂය යටතේ රුපියල් දහසක සංකේත ආදායමක් 2022 අයවැය ලේඛනයට ඇතුළු කර තිබුණි. 2022.09.30 දින වන විට රුපියල් තිස් දෙදහස් දෙසීය පනහක (32,250.00) ආදායමක් රැස්කර ගැනීමට අපට හැකි වුණි. ඒ මත පදනම් ව 2023 වර්ෂය සඳහා රුපියල් තිස් දහසක (රු.30,000.00) ආදායමක් ඇස්තමේන්තු කර තිබේ.
   - **4108 කර්මාන්තශාලා බදු** ලෙස 2022 වර්ෂයේ දී රුපියල් එක් ලක්ෂ තිසිපන්ද හසක්(රු.135,000.00) දක්වා ඇති අතර 2022.09.30 දිනට රුපියල් එක් ලක්ෂ දහතුන් දහස් හත්සිය පනහක (රු.113,000.00) ආදායමක් එකතු කර තිබෙනවා. ඒ අනුව 2023 වර්ෂය සඳහා ද මෙ ආදායම ඒ ආකාරයෙන්ම අයවැයට අතුලත් කර තිබෙනවා.

   - **4109 ව්‍යාපාර බදු** ආදායම් ශීර්ෂය පසු ගිය වර්ෂයේ රුපියල් ලක්ෂ විස්සක්(රු.2,000,000.00) ලෙස තක්සේරු කල අතර 2022.09.30 දිනට රුපියල් දා හත් ලක්ෂ හැට දහස් විස්සක (රු.1,760,020.00) මුදලක් එකතු කර ඇත. එම නිසා ඉදිරි වර්ෂය සඳහා එම මුදල රුපියල් ලක්ෂ විස්සක් (රු.2,000,000.00)ලෙසම ව්‍යාපාර සමීක්ෂණයෙන් හඳුනාගෙන ඇස්තමේන්තු කර ඇත.
   - **4112 ඉඩම් විකුණුම් බදු** 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂ තුනක් (රු.300,000.00) ලෙස සඳහන් කර තිබෙන අතර එම මුදලම 2023 වර්ෂයේ දී රුපියල් ලක්ෂය දක්වා අඩු කර අයවැය ලේඛනයට ඇතුළත්

කර තිබෙන බව දන්වමි. 2022 වර්ෂයේ මෙම ආදායම් ශීර්ෂය යටතේ ආදයම් උපයා නොමැත. එයට හේතුව වශයෙන් බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි විකිණීමේ කටයුතු සිදු නොවීමයි

- **4113 විවිධ බදු - බොරළු ප්‍රවාහනය** යටතේ පසු ගිය 2022 වර්ෂයේ දී අපේක්ෂිත ආදායම ලෙස රුපියල් ලක්ෂ පහක(රු.500,000.00) මුදලක් වෙන් කර තිබුනද ඉන් රුපියල් එක්ලක්ෂ දහදහසක් (රු.110,000.00) පමණ රැස්කර හැකිවිය. ඒ අනුව 2023 අයවැයට එම මුදල රුපියල් දෙලක්ෂ පනස් දහසක්(රු.250,000.00) දක්වා අඩු කර ඇතුළත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

2. මීලගට**4200 කුලී** යන ආදායම් ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ දී රුපියල් එක් කෝටි පන් ලක්ෂ විසි අටදහසක(රු.10,528,000.00) මුදලක් අපේක්ෂා කරන ලද අතර 2022.09.30 දිනට රුපියල් තිස් හතර ලක්ෂ අසූ හතර දහස් පන්සිය අනූහයක (රු.3,484,596.00) මුදලක් එකතු කර තිබෙනවා. ඉදිරියේ දී එමඉතිරි මුදලින් හැකි උපරිමය අය කර ගැනීමට බලාපොරොත්තු වන අතර ජනතාව අපහසුතාවයට පත් නොකර එම කටයුතු කිරීම මාගේ අපේක්ෂාවයි. එසේම 2023 වර්ෂය සඳහා කුලී ආදායම් ලෙස රුපියල් එක්කෝටි හතලිස් පන් ලක්ෂ අනූහතර දහස් හයසිය අනූවක(රු.14,594,690.00) මුදලක් ලැබේ යැයි අපේක්ෂා කරනවා. කුලී ආදායම පහත ශීර්ෂයන් අනුව විග්‍රහ කිරීමට කැමැත්තෙමි.

   - **4201 කුලී -නිල නිවාස** යටතේ 2022 වර්ෂයේ රුපියල් ලක්ෂ දෙකක් (රු.200,000.00) ලෙස ජයබිමේ ආදායම ද සමඟ තක්සේරු කර ඇත. මේවර 2023 වර්ෂය සඳහා ජයබිම ආදායම ද ඇතුළුව රුපියල් තුන්ලක්ෂ පනස් දෙදහසක මුදලක් වෙන් කර ඇත. 2022.09.30 වන විට රුපියල් එක් ලක්ෂ හැට තුන් දහස් පන්සියයක(රු.163,500.00)මුදලක් රැස්කර ගැනීමට හැකිවී ඇත.
   - **4202 කුලී - වාහන** 2022 වර්ෂයේ දී තක්සේරු කරන ලද මුදල රුපියල් විසි අට ලක්ෂ දහසිය දහස් එකසිය හැටකි.(රු.2,816,160.00) 2022.09.30 දිනට එකතු කරන ලද ආදායම රුපියල් පහලොස් ලක්ෂ අසූ දෙදහසස් පන්සිය හතලිස් දෙකකි(රු.1,582,542.00). එම ශීර්ෂයේ ආදායම ,ඉදිරි වර්සයේ දී රුපියල් තිස්තුන් ලක්ෂ හැටදහසක් (3,360,000.00)දක්වා වැඩි කර තිබෙනවා. මේ වර්ෂයේ දී මෙම ආදායම අඩු වීමට හේතු වූයේ රටේ පවතින ආර්ථික අර්බුදය මත ඉන්ධන මිළ ඉහළ යාමයි. ඉදිරි වර්ෂයේ දී බිම් තලනය කුළියට දීමේ අරමුණද ඇතිව මෙම ආදායම වැඩි කර ඇති බව ගරු සභාවට දන්වමි
   - **4203 කුලී - ඉඩම් (භූමි අවසර)** යටතේ 2022 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම රුපියල් තිස්හය ලක්ෂ විසි පන්දහසක්(රු.3,625,000.00) වේ 2023 වර්ෂය සඳහාද එම මුදල ඒ ආකාරයෙන්ම අපේක්ෂා කරන අතර ලැබුණු ආදායම රුපියල් හත්දහස් පන්සියයකි.(රු.7,500.00) තවද මෙම මුදල මේ ආකාරයෙන්ම අයවැය සඳහා අතුලත් කරන ලද්දේ කීරික්තකුලම කසලාංගනයෙන් ලැබේ යැයි අපේක්සිත ආදායම ඒ ආකායෙන්ම මෙවර අයවැය සඳහාද අතුලත් කර ඇති බව ප්‍රකාශ කරමි
   - **4204 - කුළී ගොඩනැගිළි (කඩ කුළී/විදාතා)** 2022 වර්ෂය සඳහා රුපියල් හාරලක්ෂ දෙදහසක්(රු.402,000.00) පමණ ආදායමක් ඇස්තමේන්තු කරන ලද අතර 2022.09.30 දිනට එකතු කරන ලද ආදායම හාර ලක්ෂ විසි අටදහස් පන්සියයක් පමණ(රු.428,500.00) වන අතර ඉදිරි මාස 03 තුල දී අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට බලාපොරොත්තු වේ. තවද 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනයට රුපියල් හැත්තෑ තුන්දහසක් (රු.73,000.00) අදායම් ලෙස ඇස්තමේන්තු කර ඇත. ප්‍රාදේශිය සභාව සතු කඩ කාමර 23ම මෙවර ටෙන්ඩර් දීමටඅපේක්ෂා කරන බැවින් කඩ කුලී සඳහා රුපියල් දහසක සංකේත ප්‍රතිපාදනයක් වෙන් කර ඇති නිසා මෙවර පසුගිය වසරට සාපේක්ෂව ආදායම අඩුවෙන් ඇස්තමේන්තු කර ඇත.
   - **4205 - කුළී සාප්පු** මෙම ආදායම් ශීර්ෂය යටතේ 2022 වර්ෂය සඳහා ආදායම රුපියල් හාර ලක්ෂ අසූදහසක් (රු.480,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2023 වර්ෂය සඳහා ද ආදායම රුපියල් හාරලක්ෂ අසූ දහසක් (රු.480,000.00) ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ආදායම LDSP ව්‍යාපෘතිය යටතේ කවරක්කුළම ඉදිකරමින් පවතින කඩ කාමර 08 හි කුලී අදායම් ඉපයීමට බලාපොරොත්තු වේ.
   - **4206 - කුළී- පොළවල්** 2022 වර්ෂයේ දී මෙම ආදායම ශීර්ෂය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්දහසක් (රු.150,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2022.09.30 දිනට එම ආදායම් ශීර්ෂයෙන් එකතු කරන ලද ආදායම රුපියල් විසිහයදහස් නවසිය විසිහතරකි(රු.26,924.00). නමුත් 2023 වර්ෂයේ දී මෙම අය ශීර්ෂය යටතේ රුපියල් තිස්දහසක (රු.30,000.00) ආදායමක් ඇස්තමේන්තු කර ඇත. මෙම ආදායම අඩු කිරීමට හේතුව ලෙස රට තුළ පැවති කොරෝනා වසංගතයත් සමග අතුරුවැල්ල පොළ වැසීයාමත්, ආර්ථික අර්බුදය හමුවේ වෙළෙඳුන් පොළ කරා ඒම අඩුවීමත් නිසා පොළ ආදායම් අඩු වී ඇති බව දන්වනු කැමතියි.

   - **4207 - කුළී - මස්කඩ, මාළු ලැලි, වෙළඳසැල් ටෙන්ඩර්** 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද ආදායම රුපියල් විසි අටලක්ෂ පනස් හතරදහස් අටසිය හතලිහකි.(රු.2,854,840.00) 2022.09.30 දිනට එකතු කරන ලද ආදායම රුපියල් දෙලොස් ලක්ෂ හත්තෑපන්දහස් හයසිය තිහකි(රු.1,275,630.00). ඉදිරි මාස 03දි අයකළ යුතු ආදායම් තුළ ජයබිම ටෙන්ඩර් කිරීමෙන් ඉපයීමට අපේක්ෂා කළ ආදායම ද ඇතුළත් වේ.තවද වාර්ෂික ඇස්තමේන්තුව සලකා බලා 2023 වර්ෂයේ බලාපොරොත්තුවන ආදායම රුපියල් තිස් ලක්ෂ හැත්තෑතුන්දහස් හයසිය අනූවකි (රු.3,073,690.00)

ටෙන්ඩර් ගාස්තු :

- ✓ එළගවමස්කඩ සඳහා - රු. 555,399.38
- ✓ මාළුලැලි සඳහා - රු. 424,564.22
- ✓ දියරකිරිහල් සඳහා - රු. 46,931.40
- ✓ තුරුලිය සෙවන සඳහා - රු. 879,795.00
- ✓ කඩ කාරම සඳහා - රු. 1,002,000.00
- ✓ ජංගම වෙළඳ කුටි - රු. 45,000.00
- ✓ ආර්ථික මධ්‍යස්ථානයට - රු. 120,000.00 සමන්විත වේ.

3. ඊළඟ ආදායම් ශීර්ෂය වන **4300 - බලපත්‍ර ගාස්තු** 2022 වර්ෂය සඳහා අයවැයෙන් බලාපොරොත්තු වූ ආදායම රුපියල් පහලොස් ලක්ෂ හැටපන් දහසකි(රු.1,565,000.00) එහෙත් 2022.09.30 දිනට මෙම අය ශීර්ෂයෙන් එකතු කරන ලද ආදායම දස ලක්ෂ හතලිස් නව දහස් හයසිය හතලිස් හතරකි (රු.1,049,644.00). එම මුදල පිළිබඳ සැලකිල්ලට ගෙන 2023 වර්ෂය සඳහා ආදායම රුපියල් දහහතරලක්ෂ පනස්දහසක් (රු.1,450,000.00) ඇස්තමේන්තුතර ඇත. බලපත්‍ර ගාස්තු සංයුතිය මෙසේ විග්‍රහ කිරීමට මම කැමතියි.
    - ආදායම් ශීර්ෂ **4301- වෙලඳ බලපත්‍ර** ගාස්තු යටතේ 2022 වර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ හැටපන්දහසක මුදලක් (රු.165,000.00) අපේක්ෂා කළද 2022.09.30 දිනට එකතු කරන ලද ආදායම රුපියල් එක්ලක්ෂ විසිහත්දහස්හත්සිය හැත්තෑපහකි (රු.127,775.00) මෙවර ඇස්තමේන්තුව රුපියල් එක්ලක්ෂපනස් දහසක් (රු.150,000.00)දක්වා අඩුකර ඇත.
    - **4302 - සංචාරක හෝටල්** යටතේ 2022 වර්ෂය සඳහා රුපියල් ලක්ෂදෙදක (රු.200,000.00) මුදලක් බලාපොරොත්තු වූ අතර, 2022.09.30 වන විට රුපියල් තුන්ලක්ෂ තිස්නව දහස් අනූහතරක(රු.339,094.00) ආදායමක් ලැබී ඇත. 2023 වර්ෂය සංචාරක හෝටල් සඳහා යහපත් වේ යැයි සිතා එම ආදායම 2023 වර්ෂයේ අයවැය ලේඛනයට රුපියල් ලක්ෂ හතරක් (රු.400,000.00) ලෙස වැඩි කර තිබෙනවා.
    - **4303 - බලපත්‍ර ගාස්තු පරිසර** 2022 වර්ෂය සඳහා රුපියල් ලක්ෂ දෙකක (රු.200,000.00) ආදායමක් බලාපොරොත්තු වූ අතර මේ වන විටත් එකතු කරන ලද ආදායම රුපියල් තිස් හත්දහස් පන්සියයක් (රු.37,500.00) පරිසර බලපත්‍ර නිකුත් කරනුයේ වසර තුනක කාලයක් සඳහා වීම හේතුවෙන් 2023 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම රුපියල් ලක්ෂය(රු.100,000.00) දක්වා අඩු කර ඇත.
    - **4305 - බලපත්‍ර ගාස්තු දැන්වීම් පුවරු.** යටතේ 2022 අයවැයෙන් බලාපොරොත්තු වූ ආදායම රුපියල් මිලියනයකි(රු.1,000,000.00) 2022.09.30 දක්වා ආදායම රුපියල් පන්ලක්ෂ හතලිස් පන්දහස් දෙසීය හැත්තෑපහක් (රු.545,527.00)පමණ වේ. 2023 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම රුපියල් ලක්ෂඅට දක්වා අඩු කොට ඇත. මීට හේතුව ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ මගින් වර්ග අඩියකින් අයකළ මුදළ රු.25න් අඩු කිරීමයි
4. **4400 - සේවා ගාස්තු** මෙම ආදායම් ශීර්ෂය යටතේ 2022 වර්ෂය සඳහා බලාපොරොත්තු වූ ආදායම රුපියල් පනස් දෙලක්ෂ හතලිස් නවදහසක් (රු.5,249,000.00)වේ. 2022.09.30 වන දින වනවිට ලද ආදායම රුපියල් විසි දෙලක්ෂ අසූ හත්දහස් නවසිය තිස් තුනක් (රු.2,287,933.00)පමණ වේ.2023 වර්ෂය සඳහා රුපියල් පනස් එක්ලක්ෂ හැත්තෑතුන්දහස් හාරසියයක්(රු.5,173,400.00)ලෙස ඇස්තමේන්තු කර ඇත.
    - **4401- සේවා ගාස්තු හිමිකම් ලියාපදිංචිය** යටතේ 2022 වර්ෂයේ දී අයවැය ගත කරන ලද මුදල රුපියල් දෙලක්ෂ පනස්දහසකි.(රු.250,000.00)කි 2022.09.30 දිනට රුපියල් එක් ලක්ෂ පනස්අට දහස් තුන්සිය අසූවක්(රු.158,380.00) එකතු කර ඇති අතර ඉදිරි මාස තුළ දී අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට හැකි වේ යැයි අපගේ අපේක්ෂාවයි.එම නිසා 2023 වර්ෂයේ දී ද එම මුදල වෙනසක් නොකරන ලදී. එබැවින් 2023 වර්ෂය සඳහා ද රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු.250,000.00) ඇස්තමේන්තු ගත කර ඇත.
    - **4402- සේවා ගාස්තු - ඇතුළත් වීමේ ගාස්තු** 2022 වර්ෂයේ දී අපේක්ෂා කරන ලද මුදල රුපියල් එක් ලක්ෂ එක් දහසකි (රු.101,000.00).එම මුදලම ඒ ආකාරයෙන් ම 2023 වර්ෂය සඳහා ද ඇස්තමේන්තු ගත කර ඇත.
    - **4403- වීථිරේඛා හා දීර්ඝ කාලීන** බදු බලපත්‍ර 2022 වර්ෂයට සාපේක්ෂව රුපියල් පනස්දහසක මුදලක් අඩු කර 2023 වර්ෂයේ අයවැය ලේඛනය සකස් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත ආදායම රුපියල් ලක්ෂ තුනක් වේ.(රු.300,000.00) එමෙන්ම 2022.09.30 දක්වා ලද ආදායම රුපියල් එක් ලක්ෂ විසි දෙදහසක් වේ.(රු.122,000.00)
    - **4404 - ලිපි ලේඛන පරික්ෂා කිරීම**. සැළසුම් අනුමත කිරීම හා වීථිරේඛා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා දීමට පෙර ක්ෂේත්‍ර පරික්ෂා කිරීමේ ගාස්තු 2022 වර්ෂයේ දී මෙම ශීර්ෂය යටතේ රුපියල් පන්ලක්ෂ හැත්තෑ දහසක (රු.570,000.00) ඇස්තමේන්තු කර තිබුනි. 2022.09.30 දිනට එකතු කරන ලද ආදායම රුපියල් එක් ලක්ෂ අනූදහස් හත්සියයකි.(රු.190,700.00) ඒ අනුව 2023 වර්ෂය සඳහා බලාපොරොත්තු වන ආදායම රුපියල් දෙලක්ෂ විසිදහස (රු.220,000.00)දක්වා අඩු කර ඇත.
    - **4405 - සේවා ගාස්තු පරිසරය** මෙම ආදායම් ශීර්ෂය යටතේ 2022 වර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ පනස්දහසක් (රු.150,000.00) තක්සේරු කර ඇති අතර ,2022.09.30 දිනට එකතු කරන ලද ආදායම රුපියල් තිස් දහස්

තුන්සිය හැත්තෑපහකි(රු.30,375.00). එබැවින් ,මෙවර 2023 වර්ෂය සඳහා රුපියල් ලක්ෂයක් (රු.100,000.00) දක්වා අඩු කර ඇත.

- **4406- සේවා ගාස්තු සැළසුම් අනුමත කිරීම** 2022 වර්ෂය සඳහා මෙම ආදායම් ශීර්ෂය යටතේ රුපියල් ලක්ෂ විස්සක් (රු.2,000,000.00) ඇස්තමේන්තු ගත කර ඇත. 2022.09.30 දිනට රුපියල් දස ලක්ෂ හැත්තෑනව දහස් හයසිය අටක(රු .1,079,608.00) ආදායමක් ලැබී ඇත. 2023 වර්ෂය සඳහා ලක්ෂ විසි දෙකක (රු.2,200,000.00) ආදායමක් අපේක්ෂා කරයි.
- **4409-සේවා සැපයුම් සඳහා ආකෘති පත් විකිණීම** 2022 වර්ෂයේ දී රුපියල් තුන්ලක්ෂ තිස්දහසක් (රු.330,000.00) ඇස්තමේන්තු කරන ලද අතර, 2022.09.30 වන විට රුපියල් එක්ලක්ෂ දහඅට දහස් එකසියයක(රු.118,100.00) ආදායමක් ලැබී ඇත. 2023 වර්ෂය සඳහා රුපියල් තුන් ලක්ෂ පනස් දහසක් (රු.350,000.00) ලෙස ඇස්තමේන්තු කර ඇත.
- **4452-සේවා ගාස්තු ආදාහනාගාර** 2022 වර්ෂයේ දී මේ සඳහා සංකේත ප්‍රතිපාදනයක් ලෙස රුපියල් දාහක්(රු.1,000.00) වෙන් කර ඇත.2023 වර්ෂය සඳහා ද එලෙස වෙන් කර ඇත.
- **4453- සේවා ගාස්තු භූමදාන** 2022 වර්ෂයේ දී මේ සඳහා රුපියල් පන් දහසක් (රු.5000.00) ඇස්තමේන්තු කර ඇති අතර ,2023 වර්ෂයේ දී ද එම මුදලෙහි වෙනසක් සිදු කර නොමැත.
- **4455-සේවා ගාස්තු කසල බැහැර කිරීම** 2022 වර්ෂය සඳහා රුපියල් ලක්ෂ පහක(රු.500,000.00) මුදලක් අපේක්ෂා කර ඇති අතර, 2022.09.30 දිනට ලද ආදායම රුපියල් එක් ලක්ෂ පනස්හත් දහස් හැරසිය හැටකි (රු. 157,460.00) එබැවින් 2023 වර්ෂය සඳහා ද රුපියල් ලක්ෂ පහක (රු.500,000.00) මුදලක් ඇස්තමේන්තු කර ඇත.
- **4458 සේවා ගාස්තු පොදු දේපළ වලට හානි - මාර්ග** පළුදු මේ සඳහා 2022 වර්ෂයේ දි රුපියල් ලක්ෂ දෙකක් (රු.200,000.00) බලාපොරොත්තු වූ අතර ,2022.09.30 වන විට රුපියල් එක් ලක්ෂ හත්දහස් පන්සියයක(රු.107,500.00) මුදලක් ලැබී ඇත. එම නිසා මෙවර 2023 වර්ෂය සඳහා ද රුපියල් ලක්ෂ දෙදක ( රු.200,000.00) ඇස්තමේන්තු ගත ආදායම් ඇතුළත් කර ඇත.
- **4459-සේවා ගාස්තු නල ළිං** මේ සඳහා 2022 වර්ෂයේ දී රුපියල් හත්දාහසක (රු.7000.00) ආදායමක් අපේක්ෂා කරන ලද අතර , 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් දස දහසක්(රු.10,000.00) දක්වා වැඩි කර ඇත.මෙම ඉදිරි අයවැයේ දී එම මුදල වෙනසක් සිදු කර නැත.
- **4465- සේවා ගාස්තු පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය** 2022 වර්ෂය සඳහා රුපියල් හත් ලක්ෂ අසූ දහස (රු .780,000.00)ක මුදලක්
බලාපොරොත්තු වූ අතර , 2022.09.30 දිනට එකතු කර ඇත්තේ රුපියල් දෙලක්ෂ අසූ හාරදහස් දෙසියකි (රු.284,200.00). එබැවින් 2023 වර්ෂය සඳහා රුපියල් නව ලක්ෂ තිස් පන්දහස් හාර සීයක (රු.935,400.00) මුදලක් ඇස්තමේන්තු කර ඇත.

5. 2023 අයවැය සඳහා මීලග ආදායම් ශීර්ෂය **4500 - වරෙන්තු සහ අධිහාර** යටතේ 2022 වර්ෂයට ඇස්තමේන්තු ආදායම රුපියල් පනස් හතර දහසකි (රු. 54,000.00) ක් වන අතර, 2022.09.30 දිනට ප්‍රමාද ගාස්තු ලෙස රුපියල් පන් ලක්ෂ තිස්හත් දහස් හයසිය හැත්තෑ පහක් (රු. 537,675.00) ලැබී ඇත. එසේ වීමට හේතුව LDSP ව්‍යාපෘතියේ තරියන්කුළම මාර්ගය කාපට් කිරීම ව්‍යාපෘතියේ ප්‍රමාද ගාස්තු ආදායමක් ලෙස ලැබීමයි. මේ වන විට සභාවේ නිසි අනුමැතිය ලබා නොගෙන අනවරසයෙන් ඉදිකරනු ලබන ගොඩනැගිළි හා තාප්ප පැවතීම හේතුවෙන් අනවසර ඉදිකිරීම් සඳහා දඩ අයකිරීම ආරම්භ කරමින් 2023 වර්ෂය සඳහා වරෙන්තු හා අධිහාර සඳහා රුපියල් විසිඑක් ලක්ෂ හත්දහසක(රු.2,107,000.00) ආදායමක් ඇස්තමේන්තු කර ඇත.
    - **4501 - වරෙන්තු හා අධිහාර** සඳහා රුපියල් ලක්ෂ විස්සක්ද(2,000,000.00) ප්‍රමාද ගාස්තු සඳහා රුපියල් ලක්ෂයක්ද, 4511 අධිහාර පුස්තකාල ගාස්තු සඳහා රුපියල් දෙදහසක් (රු. 2,000.00) ද 4512 ආදායම් ශීර්ෂය යටතේ නැති වූ පොත් සඳහා රුපියල් දෙදහසක් (රු. 2,000.00) ද 4513 අධිහාර වෙනත් හානි යටතේ රුපියල් දෙදහසක් ( 2,000.00) ද ලෙස සංකේත ප්‍රතිපාදන මෙම අයවැය ලේඛනයට ඇතුළත් කර තිබෙනවා.
6. **4600 - වෙනත් විකුණුම් ආදායම්** යටතේ 2022 වර්ෂය රුපියල් එක්ලක්ෂ විසි අට දහස (රු. 128,000.00) ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. නමුත් 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් පනස් ලක්ෂ අසූ දෙදහසක් දක්වා වැඩි කර ඇත.

    - **4601 - විකුණුම් ආකෘති (ටෙන්ඩර්)** සඳහා 2022 වර්ෂයේ දී රුපියල් විසිපන් දහසක් (රු. 25,000.00) ඇස්තමේන්තු කර ඇති අතර, මේවන තෙක් ආදායම් නොලැබීමට හේතුව වන්නේ ටෙන්ඩර් දැමීම ආරම්භ වන්නේ වර්ෂයේ අවසානයේ වන බැවිනි.එබැවින් 2023 වර්ෂය සඳහා එම ආදායම රුපියල් තිස් එක්දහස(රු.31,000.00) දක්වා වැඩි කර ඇති බව ගරු සභාවට ඉදිරිපත් කරන්න කැමැත්තෙමි.
    - **අළුතින් 2023 වර්ෂය සඳහා 4603 විකුණුම් ජලය -** ආදායම් ශීර්ෂය යටතේ ජල බෝතල් කර විකිණීමේ ආදායම් ලෙස රුපියල් ලක්ෂ පනහක්(රු.5,000,000.00) ඇස්තමේන්තු කර ඇත.

- තවද, **4605 - විකුණුම් පත්තර** සඳහා 2022 වර්ෂයට රුපියල් තුන් දහසක(රු.3,000.00)ක ඇස්තමේන්තුවක් ඇතුළත් කර ඇත. 2023 වර්ෂයට එම මුදල රුපියල් පනස් දහස (රු. 50,000.00) ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.
- **4699 - විකුණුම් වෙනත් (බොරළු)** මේ සඳහා 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂය (රු. 100,000.00) ක මුදලක් අයවැයට එකතු කර තිබුනද, එම ආදායම ලබා ගැනීමට නොහැකි වීම මත 2023 වර්ෂය සඳහා රුපියල් දහසක (රු.1,000.00)සංකේත ප්‍රතිපාදනයක් වෙන්කර ඇත.

7. ආදායම් ශීර්ෂ**4700 පොලී ආදායම්** ලෙස 2022 වර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ අසූ හතර දහස් හයසිය විස්සක් (රු. 184,620.00) ක් ඇස්තමේන්තු කර තිබුණා, 2022.09.30 දින වන විට තුන්ලක්ෂ අනූ අට දහස් හාරසිය එකක(රු398,401.00)මුදලක් ලැබී ඇත.එයට හේතුව වන්නේ 2021 වර්ෂයේ තැන්පතු කල ස්ථාවර තැන්පතුවේ පොළී මුදල් ලැබීම වේ. ඒ අනුව 2023 වර්ෂය සඳහා අටලක්ෂ හතලිස් හත්දහසක(රු.847,000.00)මුදලක් ඇස්තමේන්තු කර ඇත.
8. ආදායම් ශීර්ෂ **4800 විවිධ ආදායම්** ලෙස 2022 වර්ෂයේ දී රුපියල් දෙකෝටි පනස් එක් ලක්ෂ පනස් දහසක මුදලක්(රු.25,150,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2022.09.30 දිනට ලැබී ඇති ආදායම රුපියල් එක් කෝටි දහහතර ලක්ෂ විසි එක් දහස් දෙසිය හැට හතකි(රු.11,421,267.00) අපට මුද්දර ගාස්තු ලෙස ඉදිරි මාස වලදී ඉතිරි හිග මුදල් එකතු වන බව ගරු සභාවට දැනුම් දෙනු කැමැත්තෙමි. එසේම 2023 වර්ෂය සඳහා රුපියල් දෙකෝටි පනස් ලක්ෂ තිස් එක් දහසක් (රු.25,031,000.00) ඇස්තමේන්තු කර ඇත.
   ඒ යටතේ අනු ආදායම් ලෙස විග්‍රහ කිරීමේ දී
   - **4801 - මුද්දර ගාස්තු** 2022 වර්ෂයේ දී රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක් ඇස්තමේන්තු තර ඇති අතර 2023 වර්ෂයේ දී ද එම මුදලම අප ඇස්තමේන්තු කර ඇත.
   - **4804 - උසාවි දඩ** ලෙස අය වෙනු ලැබෙන ආදායම 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂ පනහක් (රු.5,000,000.00) ලෙස ඇස්තමේන්තුකර තිබුනද අප වෙත ලැබී ඇති මුදල 2022.09.30 දිනට රුපියල් තිස් එක් ලක්ෂ හතලිස් තුන්දහස් හාරසිය හතලිස් හතකි(රු.3,143,447.00) එම නිසා 2023 වර්ෂයේ දී එය රුපියල් කෝටිය (රු.10,000,000.00)ලෙස දක්වා තිබෙනවා.
   - තවද **4854 - යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභ/අලාභ** යටතේ හා 4857 කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ලාභ/අලාභ ද, 4858 ලී බඩු ඉවත් කිරීමේ ලාභ/අලාභ යන ආදායම් ශීර්ෂ සඳහා 2022 වර්ෂයට ආදායම් ඇස්තමේන්තු කර ඇත්තේ රුපියල් පනස් දහස (රු.50,000.00)බැගිනි. නමුත් 2023 වර්ෂය සඳහා රුපියල් තිස් දහස බැගින් ඇස්තමේන්තු කර තිබෙනවා.
9. **මීට අමතරව ප්‍රධාන ආදායම් ශීර්ෂයක් වන 4900 -** ව්‍යාපෘති **ආදායම්** ලෙස 2022 වර්ෂය සඳහා රුපියල් එක්කෝටි විසිහය දහසක්(රු.10,026,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2022.09.30 දිනට රුපියල් එකොලොස් ලක්ෂ දහනව දහස් හයසිය තිස්තුනක(රු.1,119,633.00) මුදලක් එකතු කර ඇති අතර ඉදිරි 2023 වර්ෂය සඳහා රුපියල් එක්කෝටි පනස් පන් ලක්ෂයක් (රු.15,500,000.00) ලැබේවි යැයි අප ඇස්තමේන්තු කර අයවැයට ඇතුළත් කර ඇත.
   එහි උප ආදායම් ශීර්ෂ ලෙස දක්වන විට,
   - ආදායම් ශීර්ෂ **4901 - ආදායම් ව්‍යාපෘති** යටතේ 2022 වර්ෂයේදී බ්ලොක්ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ හැත්තෑවක්(රු.7,000,000.00) ,පානීය ජල ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ විස්සක්(රු.2,000,000.00) ද ,වාහන සේවා මධ්‍යස්ථානයෙන් රුපියල් ලක්ෂ පහක්(රු.500,000.00) ද, ලෙස ඇස්තමේන්තු කර ඇත.
   - **4903 -** සූරිය පැනල ව්‍යාපෘතිය **ආදායම්** ඇස්තමේන්තු ගත කර ඇත. 2023 වර්ෂය සඳහා නව ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ඇතුළත් කරන අතර රුපියල් ලක්ෂ හැටක(රු.6,000,000.00) මුදලක් ඇස්තමේන්තු කර තිබෙනවා
10. මීළඟ ප්‍රධාන ආදායම් ශීර්ෂය ලෙස **5100 - පුනරාවර්තන වියදම් සඳහා** ලැබීම් යටතේ 2022 වර්ෂය සඳහා දෙකෝටි අසූ ලක්ෂ දොලොස් දහස් අටසිය පහලවක් (28,012,815.00)ඇස්තමේන්තු කර ඇත. 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් දෙකෝටි අනූදෙලක්ෂ හතලිස් පන් දහස් තුන්සිය හැත්තෑවක්(රු.29,245,370.00)ඇස්තමේන්තු කර තිබෙනවා.
    එය විග්‍රහ කිරීමේ දී,
    - ආදායම් ශීර්ෂ **5101 සේවක වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණ** 2022 වර්ෂය සඳහා රුපියල් දෙකෝටි විසි ලක්ෂ පනස් දෙදහස් අටසිය පහළව (රු. 22,052,815.00) ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2023 වර්ෂය සඳහා රුපියල් දෙකෝටි පනස්දෙලක්ෂ අසූ පන්දහස් තුන්සිය හැත්තෑවක් (රු.25,285,370.00)ලෙස ඇස්තමේන්තු කර ඇත.එය නිලධාරියා ගේ ජොෂ්‍යත්වය හා අනුමත කාර්යය මණ්ඩලය මත පදනම් වේ.
    - **5102 - මන්ත්‍රී දීමනා ප්‍රතිපූරණය** 2022 වර්ෂයේ දී මෙන් ම 2023 වර්ෂයේ දී ද කිසිදු වෙනසක් සිදු වී නැති අතර, එම මුදල රුපියල් තිස් නව ලක්ෂ හැට දහස (රු. 3,960,000.00) කි. මෙම ආදායම් ශීර්ෂ සඳහා අපට පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපූර්ණය කර දෙන බව මතක් කරන්නට කැමැත්තෙමි.
11. අවසාන ප්‍රධාන ආදායම් ශීර්ෂය ලෙස අංක **5200 - විස්තීරණ** ආදායමේ හඳුනාගන්නා ප්‍රාග්ධන ප්‍රධාන ලෙස 2022 වර්ෂයේ දී රුපියල් දෙකෝටි පනස් හතර ලක්ෂයක් (රු.25,400,000.00) ඇස්තමේන්තු කර ඇති අතර 2022.09.30 දිනටඅප වෙත ලැබී ඇති මුදල වන රුපියල් දෙකෝටි හතලිස් ලක්ෂ හැත්තෑහතර දහස් තුන්සිය විසිපහක (රු. 24,074,325.00) මුදලද

සැලකිල්ලට ගෙන මෙම මුදල 2023 වර්ෂයේ දී රුපියල් එක්කෝටි තිස් අට ලක්ෂ විසි එක් දහස් අටසිය හතලිස් හයක් ( 13,821,846.00) ලෙස මෙවර ඇස්තමේන්තු කර තිබෙනවා.

මෙය අනු කොටස් ලෙස ගත් විට,

- 5201 - පරිත්‍යාග මධ්‍යම රජය යටතේ රුපියල් අසූ අට ලක්ෂ විසිඑක් දහස් අටසිය හතලිස් හයක් (රු. 8,821,846.00) ද
- 5202 - පරිත්‍යාග පළාත් සභා යටතේ රුපියල් ලක්ෂ පනහක් (රු. 5,000,000.00) ඉදිරි 2023 වර්ෂයට ලැබේ යැයි ඇස්තමේන්තු කර තිබෙනවා.

➢ ඒ අනුව මෙම 2023 වර්ෂයේ අයවැය ලේඛනයේ වැඩ සටහන් ලෙස ගත් කල :

i. වැඩසටහන් අංක 01. පොදු පරිපාලනය යටතේ රැස් කිරීමට බලාපොරොත්තුවන මුළු ආදායම රුපියල් හාරකෝටි හැට හතරලක්ෂ අසූපන්දහස් හත්සීය විස්ස (රු.46,485,720.00) කි.

ii. වැඩසටහන් අංක 02 සේවා හා බදු ලංකාව පුරාම ක්‍රියාත්මක නොවන වැඩසටහනක් බැවින් එම වැඩසටහන සඳහා වෙන් කිරීමක් සිදුකර නැත.

iii. වැඩසටහන් අංක 03 සෞඛ්‍ය සේවා යටතේ රැස් කිරීමට අපේක්ෂිත ආදායම අසූ ලක්ෂ හතලිස් අට දහස් හත්සිය විස්ස (රු.8,048,720.00) කි.

iv. වැඩසටහන් අංක 04 භෞතික සැළසුම් යටතේ රැස් කිරීමට අපේක්ෂිත මුලු ආදායම රුපියල් තුන්කෝටි තිස්පන්ලක්ෂ නවදහස් තුන්සිය තිස්හය (රු.35,309,336.00)කි.

v. වැඩසටහන් අංක 05 ජල සැපයුම් මෙම වැඩසටහන අප ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක නොවන වැඩසටහනක් බැවින් ඒ සඳහා මුදල් වෙන්කිරීමක් සිදුකර නොමැත.

vi. වැඩසටහන් අංක 06 මහජන උපයෝගිතා සේවා යටතේ රැස්කිරීමට අපේක්ෂිත මුළු ආදායම රුපියල් එක්කෝටි හතලිස් එක් ලක්ෂ දහහත් දහස් හයසිය පනහ (රු.14,117,650.00) කි.

vii. වැඩසටහන් අංක 07 සුහසාධක යටතේ රැස්කිරීමට අපේක්ෂිත මුළු ආදායම රුපියල් එක්කෝටි දහනව ලක්ෂ හයදහස් අටසිය අසූව (රු.11,906,880.00) කි.

viii. වැඩසටහන් අංක 08 කුණු කසල මෙහෙයවීම මෙම වැඩසටහන අප ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක නොවන වැඩසටහනක් බැවින් ඒ සඳහා මුදල් වෙන්කිරීමක් සිදුකර නොමැත.

➢ ඒ අනුව 2023 වර්ෂය සඳහා එකතු කිරීමට බලාපොරොත්තුවන ස්වයං උත්පාදිත ආදායම රුපියල් පන්කෝටි හතලිස්පන්ලක්ෂ විසිදහස (රු.72801,090.00) කි.

➢ ප්‍රාග්ධන ආධාර මුදල් රුපියල් තුන් කෝටි හතලිස් ලක්ෂය (රු.34,000,000.00) කි. ඉන් විස්තීරණ ආදායමේ හඳුනාගන්නා ප්‍රාග්ධන ප්‍රධානය රුපියල් එක් කෝටි තිස්අට ලක්ෂ විසිඑක් දහස් අටසිය හතලිස් හය ( 13,821,846.00) කි.

**<u>වියදම් පිළිබඳ විග්‍රහය</u>**

2023අයවැය ලේඛනයේ එල්.ජී.15/08 ආකෘතියෙහි දක්වා ඇති වියදම් සාරාංශය විග්‍රහ කිරීම පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටිනවා.

1. වියදම් ශීර්ෂ 1000 වැටුප් හා වේතන යටතේ 2022 වර්ෂය සඳහා රුපියල් තුන්කෝටි හැත්තෑ හත් ලක්ෂ විසිහත්දහස් අටසිය අනූ පහක් (රු37.,727,895) මුදලින් වියදම් ලෙස පෙන්වා දී ඇති අතර මේ වන විට 2022.09.30 දිනට වියදම රුපියල් දෙකෝටි තුන් ලක්ෂ හැට එක්දහස් අටසිය තිහ (20,361,830.00) කි. ඒ අනුව 2023 වර්ෂය සඳහා වැටුප් වේතන යටතේ රුපියල් හාරකෝටි දස ලක්ෂ තිස්දෙදහස් අනූතුනක් (රු.41,032,093.00) ක් ලෙස ඇස්තමේන්තු කර තිබෙනවා.
   ඒ යටතේ විග්‍රහ කිරීමේ දී,
   - 1001 වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂය සඳහා රුපියල් දෙකෝටි විසි ලක්ෂ විසි අට දහස් තුන්සිය විසිපහක (රු.22,028,325.00) මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර මේ දක්වා වියදම වී ඇති මුදල රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂ හැටහය දහස් පනහකි(රු.12,566,050.00) 2023 වර්ෂය සඳහා එයද සැලකිල්ලට ගෙන අනියම් හා ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් ද සැලකිල්ලට ගෙන මෙහි රුපියල් දෙකෝටි විසි ලක්ෂහැටහත් දහස් දෙසීය අටකි (රු.22,067,208.00)
   - 1001-1 පෙර පාසල් ගාස්තු සඳහා 2022 වර්ෂයේ දී වියදම් වෙන්කර ඇත්තේ රුපියල් තුන්ලක්ෂ අනූ හයදහසක් (රු.396,000.00) ලෙස වන අතර 2022.09.30 දක්වා වියදම රුපියල් එක්ලක්ෂ හතලිස් හත්දහස් තුන්සිය පනහකි.(රු.147,350.00) ඒ අනුව 2023 වර්ෂය සඳහා රුපියල් හාරලක්ෂ විසි දෙදහස් හාරසියයක් (රු.422,400.00) වියදම් වශයෙන් වෙන් කර ඇත.

- 1001-2 දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු සඳහා වියදම් 2022 වර්ෂයේ රුපියල් තුන ලක්ෂ අසූ හතර දහසක (රු.384,000.00) මුදල් වෙන් කර ඇති අතර සත්‍ය වියදම 2022.09.30 දිනට පහළොස්දහසකි ඊට හේතුව 2022 වර්ෂයේදී දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකාව අනියම් සේවිකාවක් ලෙස සේවයට බඳවා ගැනීමයි. ඒ හේතුව මත 2023 අයවැය තුලද මෙම වියදම සඳහා වෙන් කිරීමක් සිදුකර නැත

- **1002අතිකාල** වැය විෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් දාසය ලක්ෂ හැත්තෑ අට දහස් නවසිය හැත්තෑ පහක් (රු.1,678,975.00)ලෙස ඇස්තමේන්තු කර තිබෙනවා. මෙවර එය රුපියල් පහලොස් ලක්ෂ අසූ දහසක් (රු.1,580,000.00) ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
- **1003-1 අන්තර් දීමනා** 2022 වර්ෂය ට දාහතර ලක්ෂ දසදහසක(රු.1,410,000.00) පමණ මුදලක්වෙන් කර ඇති අතර 2023 වර්ෂය සඳහා ද දාහතර ලක්ෂ දසදහසක (රු.1,410,000.00) පමණ මුදලක් වෙන් කර ඇත.
- **1003-2 ජීවන වියදම් දීමනාව** සඳහා 2022 වර්ෂයේ දී රුපියල් හැටලක්ෂ අසූහතර දහසක(රු.6,084,000.00)මුදලක් වෙන්කර ඇත. 2023 වර්ෂය සඳහා ද එම මුදලම වෙන්කර තිබෙනවා.
- 1003-3 අතිරේක දීමනාව 2022 වර්ෂය සඳහා රුපියල් හැට එක්දහස් අටසියයක (රු.61,800.00)මුදලක් වෙන්කර ඇති අතර, 2023 වර්ෂයට රුපියල් තිස්නවදහස් හයසියයක(රු.39,600.00)ක මුදලක් වෙන්කර කර තිබෙනවා.
- 1003-4 සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 2022 වර්ෂයේ වෙන් කිරීමක් සිදු කර නොතිබුන නමුත්,2023 වර්ෂය සඳහා රුපියල් තුන්ලක්ෂ පනස් අට දහස් අටසිය තිස් පහක(රු.358,835.00) මුදලක් වෙන් කර ඇත.
- **1003-5 රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල** 2022 වර්ෂය සඳහා රුපියල් දස ලක්ෂ හැට දෙදහස් තුන්සිය අනූපහක්(රු.1,062,395.00) ලෙස වෙන්කර ඇත. 2022.09.30දක්වා වියදම රුපියල් තුන්ලක්ෂ දස දහස් අසූ තුනක්(රු.310,083.00)වේ. 2023 වර්ෂය සඳහා රුපියල් හය ලක්ෂ තිස්පන්දහස් දෙසීය පනහක්(රු.635,250.00)දක්වා ඇස්තමේන්තුව අඩු කර ඇත.
- 1003-6 විශේෂ දීමනාව- 2022 වර්ෂයේ දී මෙම දීමනාව මූලික වැටුපට එක් කොට ගෙවීම් සිදුකර ඇත.ඊට හේතුව 2022 අයවැය සකස් කිරීමෙන් පසු ලබා දුන් දීමනාවක් වීමයි. නමුත් 2023 වර්ෂය සඳහා එය රුපියල් ලක්ෂ තිස්නවයක් (රු.3,900,000.00)ලෙස වෙන් කර ඇත.
- **1004-1 මන්ත්‍රී දීමනා** 2022 වර්ෂයට සමාන මුදලක් 2023 වර්ෂයේදීත් වෙන් කර ඇත, එය රුපියල් තිස්නව ලක්ෂ හැටදහසක් (රු.3,960,000.00)වේ.
- **1004-2 සභික සංග්‍රහ වියදම් දීමනා** 2022 වර්ෂයේ දී රුපියල් දෙලක්ෂ හයදහස් හාරසියයක(රු.206,400.00) මුදලක් වෙන් කර ඇත. 2022.09.30 දක්වා වියදම රුපියල් හැත්තෑතුන්දහස් හයසිය අසූවක්(රු.73,680.00)වේ. 2023 වර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ දහඅට දහස් අටසියයක(රු.118,800.00) මුදලක් වෙන් කර තිබෙනවා. රජයේ නිකුත් කරන චක්‍ර ලේඛණ අනුව වෙනස් වීම සිදුවේ.
- **1004-3 සභික දුරකථන වියදම් දීමනා** යටතේ ගරු සභාපති තුමාගේ සහ උප සභාපති තුමාගේ දුරකථන වියදම් වල වෙනසක් සිදු වී නැත.එය රුපියල් හැටදහසක් (රු.60,000.00) වේ.
- **1004-4 සභික** කමිටුව දීමනා 2022 වර්ෂයේ දී රුපියල් තුන්ලක්ෂ අනූහය දහසක(රු.396,000) මුදලක් වෙන් කර ඇති අතර 2023 වර්ෂයේ දී ද එම මුදල එසේම අයවැයට ඇතුළත් කර ඇත.

2. මීළඟට ගමන් ගාස්තු වැය විෂය**1100 -ගමන් ගාස්තු** යටතේ 2022 වර්ෂයේ දී රුපියල් අට ලක්ෂ පන්දහස (රු.805,000.00) ක මුදලක් වෙන්කර ඇති අතර 2023 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල රුපියල් අටලක්ෂ දාහත්දහසක් (රු.817,000.00)පමණ වේ.
    - **1101 ගමන් ගාස්තු දේශීය යටතේ 2022 වර්ෂය සඳහා** රුපියල් හය ලක්ෂ අසූතුන් දහසක්(රු.683,000.00) වෙන් කර ඇති අතර, 2022.09.30 වන විට රුපියල් තුන් ලක්ෂ අනූ හතර දහස් හාරසිය පනස් එකක (රු.394,451.00) වියදමක් දරා ඇත. 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් හය ලක්ෂ අසූ එක් දහසක් (රු.681,000.00) දක්වා අඩුකර ඇත.
    - **1101-1 ගමන් ගාස්තු පුහුණු**- 2022 වර්ෂයේදී රුපියල් එක්ලක්ෂ විසිදහසක (රු.120,000.00) මුදලක් වෙන් කරන ලද අතර, 2022.09.30 දක්වා රුපියල් එක් ලක්ෂ දහදහස් තුන්සිය තිහක (රු. 110,330.00) මුදලක් වියදම් කර ඇත. 2023 වර්ෂය සඳහා එක් ලක්ෂ තිස්පන්දහසක (රු. 135,000.00) මුදලක් වෙන්කර ඇත.
    - **1102 - ගමන් ගාස්තු විදේශීය** සඳහා රුපියල් දහසක සංකේත ප්‍රතිපාදනය 2023 වර්ෂයට වෙන්කර ඇත.
3. **මීළඟ ප්‍රධාන වැය ශීර්ෂය වනුයේ 1200 - සැපයුම් -** 2022 වර්ෂයේ දී මේ සඳහා රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ හාර දහස් පහක (රු. 14,704,005.00) මුදලක් වෙන් කර ඇත. 2023 වර්ෂය සඳහා එම මුදල වැඩි කර රුපියල් එක් කෝටි පනස් හතර ලක්ෂ හතලිස් දහසක (රු. 15,440,000.00) මුදලක් වෙන් කර ඇත.
එම ශීර්ෂය පහත පරිදි විග්‍රහ කර දක්වමි.
    - **1201-1 ලිපිද්‍රව්‍ය** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේදී රුපියල් හය ලක්ෂ හතලිස් හත් දහසක (රු. 647,000.00) මුදලක් වෙන් කරන ලදි. 2022.09.30 දක්වා රුපියල් දෙලක්ෂ හැත්තෑ තුන්දහස් හත්සිය අටක (රු.

273,708.00) මුදලක් වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා ආර්ථික තත්ත්වය ද සලකා බලා එම මුදල රුපියල් දස ලක්ෂ පනස් එක් දහස (රු. 1,051,000.00) ක් දක්වා වැඩි කර ඇති බව දන්වුන කැමැත්තෙමි.

- **1201-2 මුද්‍රණ කිරීම** - 2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් හාර ලක්ෂ පහලොස් දහස (රු. 415,000.00) කි. 2022.09.30 දක්වා රුපියල් පනස් හතර දහස් හත්සිය පනස් පහ (රු. 54,755.00) ක මුදලක් වියදම ලෙස දරා ඇත. නමුත් 2023 වර්ෂය සඳහා මෙම මුදල රුපියල් ලක්ෂ තුන ( රු. 300,000.00) දක්වා අඩු කර ඇත.
- **1201-3 ලිපි ද්‍රව්‍ය හා පත්තර** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් එක් ලක්ෂ තිස්තුන් දහසක (රු. 133,000.00) මුදලක් වෙන් කර ඇති අතර, ඉන් රුපියල් පනස් අට දහස් පන්සියය (රු. 58,500.00) ක මුදලක් 2022.09.30 දක්වා වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා රුපියල් එක් ලක්ෂ පනස හය දහස (රු. 156,000.00) ක මුදල් ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.
- **1202- කාර්යාලීය සැපයුම්** 2022 වර්ෂය සඳහා රුපියල් අසූ ලක්ෂ හැට නව දහසක (රු. 8,069,000.00) මුදලක් අයවැයෙන් වෙන් කර තිබුනි. 2023 වර්ෂය සඳහා පවතින ආර්ථික තත්ත්වය ද සලකා බලා රුපියල් අසූ ලක්ෂ අසූ පන්දහසක ( රු.ප 8,085,000.00) මුදලක් වෙන් කර ඇත.
  ඒවා පහත පරිදි විග්‍රහ කරමි.
  - බ්ලොක් ගල් නිෂ්පාදන සඳහා රු. 6,300,000.00 (රු. ලක්ෂ හැට තුනක්)
  - වාහන සේවා මධ්‍යස්ථානය සඳහා රු. 300,000.00 (රු. ලක්ෂ තුනක්)
  - ජල ව්‍යාපෘතිය සඳහා රු. 185,000.00 (රු. එක් ලක්ෂ අසූ පන්දහස)
- **1203- වීදි පහන් උපාංග** - 2022 වර්ෂය සඳහා අයවැයෙන් රුපියල් ලක්ෂ එකොලහක (රු. 1,100,000.00) මුදලක් වෙන් කර තිබුනු අතර, 2022.09.30 වන විට රුපියල් හාරලක්ෂ තිස් නව දහස් හයසිය හැත්තෑ පහක (රු. 439,675.00) වියදමක් දරා ඇත. එයද සලකා බලා 2023 වර්ෂය සඳහා රුපියල් ලක්ෂ අටක ( රු. 800,000.00) මුදලක් අයවැයට ඇතුලත් කර ඇත.
- **1205 - නිළ ඇඳුම්** - 2022 වර්ෂයේ දී රුපියල් එක්ලක්ෂ දස දහසක (රු. 110,000.00) ප්‍රතිපාදනයක් වෙන් කර තිබුන ද 2022.09.30 වන විට රුපියල් අසූ හතර දහසක (රු. 84,000.00) වැයක් දරා තිබුනි. එබැවින් චක්‍ර ලේඛ අනුව සලකා බලා රුපියල් අසූ හයදහසක (රු.86,000.00) ප්‍රතිපාදනයක් වෙන්කර ඇත.
- **1208 -ඉන්ධන-** මෙම වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ දී අපි රුපියල් හතලිස් ලක්ෂ හැත්තෑනව දහස් පහක(රු.4,079,005.00) මුදලක් වෙන් කර තිබුනා. ඉන් 2022.09.30 දක්වා රුපියල් විසිපන් ලක්ෂ තිස්හතර දහස් හාරසිය හතරක(රු.2,534,404.00) වියදමක් දරා තිබෙනවා. නමුත් 2023 වර්ෂයේ දී පවතින මිල විචලනයන් ද සැලකිල්ලට ගෙන රුපියල් හතලිස් අට ලක්ෂ එකොලොස් දහසක් (රු. 4,811,000.00) ප්‍රතිපාදන වෙන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.
- **1209 - ආදාහනාගාර සැපයුම්** සඳහා 2023 වර්ෂයේ දී ද රුපියල් දහසක (රු. 1000.00) සංකේත ප්‍රතිපාදනයක් වෙන් කරන ලදි.
- **1211 - සේවක** පුහුණු සඳහා 2022 වර්ෂයේ දී රුපියල් එක්ලක්ෂ පනස් දහසක් (රු. 150,000.00) අයවැය සඳහා ඇතුලත් කළ අතර, 2023 වර්ෂය සඳහා ද එම මුදලෙහි කිසිදු වෙනසක් සිදු කර නැත.

4. මීළඟ ප්‍රධාන වැය ශීර්ෂය වන්නේ **අලුත්වැඩියා හා නඩත්තු 1300** සඳහා 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂ හතලිස් හයක් (රු. 4,600,000.00) වෙන් කරන ලදි. රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ වාහන අමතර කොටස් වල මිල ඉහල යාම හේතුවෙන් එම ශීර්ෂයට 2023 වර්ෂයේ දී රුපියල් අසූ දෙලක්ෂ තිස් හය දහස් නමසිය අනූ පහක (රු. 8,236,995.00) මුදලක් වෙන් කරනු ලැබූ බව ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

ඉහත වැය ශීර්ෂය පහත පරිදි විග්‍රහ කරමි.

- **1301 අළුත්වැඩියා හා නඩත්තු - කාර්යාල උපකරණ** මෙම වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00) ප්‍රතිපාදන වෙන්කරනු ලැබූ අතර, 2023 වර්ෂයේදී එම මුදල එසේම අයවැයට ඇතුලත් කර ඇත.
- **1302 අලුත්වැඩියා හා නඩත්තු - ගොඩනැගිළි** මෙම වැය ශීර්ෂය සඳහා 2022 දී රුපියල් ලක්ෂ නමයක් (රු. 900,000.00) වෙන්කරන ලදි. නමුත් තුරුලිය සෙවන නිවාඩු නිකේතනය 2023 වර්ෂයේදී අලුත්වැඩියා කිරීමේ බලාපොරොත්තුවෙන් රුපියල් විසි එක් ලක්ෂ එක් දහසක (රු. 2,101,000.00) මුදල් ප්‍රතිපාදනයක් වෙන් කළ බව ප්‍රකාශ කරමි.
- **1304 අළුත්වැඩියා හා නඩත්තු - වාහන** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේදී රුපියල් ලක්ෂ විස්සක (රු. 2,000,000.00) ප්‍රතිපාදනයක් වෙන් කල අතර, ඉන් රුපියල් හත් ලක්ෂ විසි හත් දහස් හත්සිය තිහක ( රු. 727,730.00) මුදලක් මේ වන විට වියදම් වී ඇත. 2023 වර්ෂය සඳහා රුපියල් විසි හත් ලක්ෂ තිස් පන්දහස් නමසිය අනූ පහක (රු. 2,735,995.00) ප්‍රතිපාදනයක් අයවැයට ඇතුලත් කර ඇත.
- **1305 - අළුත්වැඩියා හා නඩත්තු - පාරවල්** 2022 වර්ෂයේදී රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000.00) ප්‍රතිපාදනයක් වෙන් කළ නමුත් ආර්ථික අර්බුදයත් සමග සංවර්ධන කටයුතු නවතා දැමූ බැවින් එම මුදල

වියදම් වී නොමැත. එසේ වුවත් රට යථා තත්ත්වයට පත්වේයැයි අපේක්ෂාවෙන් 2023 වර්ෂයේ දී ද එම ප්‍රතිපාදනය එසේම වෙන් කර ඇත.

- **1305 - අළුත්වැඩියා හා නඩත්තු - යන්ත්‍ර** මෙම වැය ශීර්ෂය 2023 වර්ෂයේදී අයවැයට අලුතින් එක් කොට ඇත. ඒ සඳහා රුපියල් ලක්ෂ දෙකක ( රු. 200,000.00) මුදලක් වෙන් කර ඇත.
- **1312 - අළුත්වැඩියා හා නඩත්තු - පාලම් හා බෝක්කු** වැය විෂය සඳහා 2022 වර්ෂයේදී රුපියල් ලක්ෂ පහක (රු. 500,000.00) මුදලක් වෙන් කළ නමුත් රජයේ අනපනත් පරිදි සංවර්ධන කටයුතු නවතා දැමීම හේතුවෙන් එම මුදලින් රුපියල් හතලිස් පන්දහසක් (රු. 45,000.00) පමන වියදම් වී ඇත. ඒ අනුව 2023 වර්ෂයේ දී රුපියල් ලක්ෂ විස්සක (රු. 2,000,000.00) ප්‍රතිපාදනයක් වෙන් කල බව ගරු සභාවට දන්වමි.

5. 2023 අයවැය ලේඛනයේ අංක **1400 - පරිපාලන වියදම්** වැය ශීර්ෂය සඳහා රුපියල් දහසය ලක්ෂ දහතුන් දහස් හයසිය පහක (රු. 1,613,605.00) ප්‍රතිපාදන 2022 වර්ෂයේදී වෙන් කර ඇත. ඉන් රුපියල් පන් ලක්ෂ අනු පන්දහස් පන්සිය අනූවක (රු. 595,590.00) මුදලක් මේ වන විට වැය වී ඇත. 2023 වර්ෂය සඳහා රුපියල් දාහතර ලක්ෂ අනූපන්දහස් හැත්තෑවක (රු. 1,495,070.00) මුදලක් අයවැයට ඇතුලත් කර ඇත.

එම වැය විෂය වෙන් වෙන් වශයෙන් විග්‍රහ කිරීමේ දී,

- **1401 - දුරකථන** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේදී රුපියල් එක්ලක්ෂ තිස් දහසක (රු. 130,000.00) මුදලක් වෙන් කරන ලදි. 2023 වර්ෂයේදී එම මුදල රුපියල් දෙලක්ෂ විසි දෙදහස් දෙසිය තිහ (රු. 222,230.00) දක්වා වැඩි කර ඇත.
- **1402 - විදුලිය** වැය ශීර්ෂයට 2022 වර්ෂයේ රුපියල් පන්ලක්ෂ විසි දහසක (රු. 520,000.00) මුදලක් වෙන් කර තිබුන ද ඉන් රුපියල් එක්ලක්ෂ අසූ හතර දහස් නමසිය පහක (රු. 184,905.00) මුදලක් 2022.09.30 වන විටත් වැය වී ඇත. එම කරුණු සලකා බලා 2023 වර්ෂය සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑ අට දහස් හාරසියයක් (රු. 278,400.00) දක්වා ප්‍රතිපාදන අඩු කර ඇත.
- **1403 - ජලය** මෙම වැය ශීර්ෂයට රුපියල් දෙලක්ෂ එක් දහසක (රු. 201,000.00) මුදලක් 2022 වර්ෂයේ දී වෙන් කළ අතර, 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් එක් ලක්ෂ හැට නම දහස් හාරසිය තිස් පහ (රු. 169,435.00) දක්වා අඩු කර ඇත.
- **1404 - තැපැල් ගාස්තු** වැය විෂය සඳහා 2022 දී රුපියල් හැත්තෑ දහසක (රු. 70,000.00) මුදලක් ඇස්තමේන්තු කළ අතර, මේ වන විට රුපියල් පනස් හත් දහස් එකසිය හතරක් (රු. 57,104.00) වැය වී ඇත. ඒ අනුව, 2023 වර්ෂය සඳහා රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදලක් ඇස්තමේන්තු කර ඇත.
- **1405 සංග්‍රහ වියදම** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් එක්ලක්ෂ විසිදහසක් (රු.120,000.00) වෙන් කර ඇති අතර, ඉන් රුපියල් අසූ හතර දහස් හාරසිය තිස් හතක (රු. 84,437.00) මුදලක් 2022.09.30 වන විට වැය වී ඇත. 2023 වර්ෂයට රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00) මුදලක් අයවැයට ඇතුලත් කර ඇත.
- **1407 - නීති ගාස්තු** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදලක් වෙන් කරන ලදි. 2023 වර්ෂය සඳහා එය රුපියල් පනස් දහස (රු. 50,000.00) දක්වා අඩු කර ඇත.
- **1408 - විගණන ගාස්තු** වැය ශීර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහස (රු. 150,000.00) මුදලක් 2022 වර්ෂයේදී වෙන් කළ අතර, එම මුදල එසේම 2023 වර්ෂයට ද ඇතුලත් කර ඇත.
- **1409 - මිනින්දෝරු ගාස්තු** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේදී මෙන්ම 2023 වර්ෂය සඳහා ද රුපියල් පනස් දහසක් (රු. 50,000.00) ඇස්තමේන්තු කර ඇත.
- **1410 - පාවිත්‍ර කිරීම** වැය ශීර්ෂය සඳහා 2023 වර්ෂයට රුපියල් දහසක (රු. 1000.00) සංකේත ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.
- **1452 - වාහන රක්ෂණය** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේදී රුපියල් දෙලක්ෂ හැට දෙදහස් හයසිය පහක (රු. 262,605.00) මුදලක් වෙන් කර තිබුනි. 2022.09.30 දිනට රුපියල් විසි හත් දහස් හාරසිය හැට එකක (රු. 27,461.00) වැයක් දරා ඇත. ඉතිරි වාහන සඳහා රක්ෂණ කටයුතු ඉදිරි මාස තුනේ (03) දී සිදු කිරීමට නියමිතයි. ඒ අනුව 2023 වර්ෂය සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑ හතර දහස් පහක (රු. 274,005.00) මුදලක් වෙන් කර ඇත.

6. අනෙක් ප්‍රධාන වියදම් විෂය වන අංක 1500 සුභ සාධක ගෙවීම යටතේ රුපියල් පනස් තුන් ලක්ෂ අනූ දහස් හයසිය විස්සක (රු. 5,390,620.00) මුදලක් 2022 වර්ෂයට වෙන් කර ඇත. ඉන් රුපියල් නමලක්ෂ හැත්තෑ දහස් හයසිය හතලිස් පහක (රු. 970,645.00) මුදලක් සුභසාධන කටයුතු සඳහා වැය කර ඇත. 2023 වර්ෂයට රුපියල් එක් කෝටි එක් ලක්ෂ හැට හය දහසක (රු. 10,166,000.00) ප්‍රතිපාදන අයවැයට ඇතුලත් කර ඇති බව ගරු සභාවට දැනුම් දෙනු කැමැත්තේමි.

   වෙන් වෙන් වශයෙන් ගත් විට

- **1501 -සමාජ සේවා ගෙවීම්** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ රුපියල් විසි ලක්ෂ හැත්තෑ හය දහස් හයසිය විස්සක (රු. 2,076,620.00) මුදලක් වෙන් කර තිබුනා. 2023 වර්ෂයේ දී රුපියල් හැත්තෑ හය ලක්ෂ

අසූ දෙදහසක (රු. 7,682,000.00) මුදලක් වෙන් කර ඇත්තේ 2030 වර්ෂය වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසර සංවර්ධන ඉලක්ක පදනම් කරගෙනය.

- **1502 -ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා** 2022 වර්ෂයේදී රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදලක් වෙන් කර ඇති අතර, රුපියල් හතලිස් නමදහස් නමසිය පනහක (රු. 49,950.00) මුදලක් මේ වන විට වැය කර ඇත. 2023 වර්ෂයේදී ද එම මුදලෙහි වෙනසක් සිදු නැත.
- **1503 -උත්සව සඳහා** ගෙවීම් වැය ශීර්ෂයට 2022 වර්ෂයේදී රුපියල් අසූ පන්දහස (රු. 85,000.00) ක මුදලක් වෙන් කර තිබූ අතර, 2023 වර්ෂය සඳහා එම මුදල රුපියල් ලක්ෂය (රු. 100,000.00) දක්වා වැඩි කර ඇත.
- **1504 - දුම්රිය ප්‍රවේශ පත්‍ර** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ දී රුපියල් විසි පන්දහසක (රු. 25,000.00) වෙන් කිරීමක් සිදු කර ඇති අතර, ඉන් රුපියල් දහතුන් දහස් හැත්තෑවක (රු. 13,070.00) මුදලක් මේ වන විට වැය වී ඇත. එබැවින් 2023 වර්ෂය සඳහා රුපියල් තිස්හතර දහසක (රු. 34,000.00) ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.
- **1505 - පරිත්‍යාග** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේදී වෙන් කළ මුදල රුපියල් විසි හය ලක්ෂ හාරදහසක් (රු. 2,604,000.00) වේ. රුපියල් හාර ලක්ෂ අනූ පන් දහස් පන්සියයක (රු. 495,500.00) මුදලක් මේ වන විට වැය කර ඇත. 2023 වර්ෂයේ දී රුපියල් විසි ලක්ෂ පනස් දහසක (රු. 2,050,000.00) මුදලක් වෙන් කර ඇත.

- **1507 - දිළිඳු සහන ගෙවීම්** සඳහා 2022 අයවැය මගින් රුපියල් ලක්ෂ තුනක (රු. 300,000.00) ප්‍රතිපාදන වෙන් කළ ද, 2023 වර්ෂයේ දී ඒ සඳහා ප්‍රතිපාදන මෙම වැය ශීර්ෂය යටතේ වෙන් කර නොමැති වුව ද, 1501 සමාජ සේවා ගෙවීම් යටතේ සාගින්න නැති කිරීම හා ආහාර සුරක්ෂිතතාවය යන වැඩසටහන යටතේ ඒ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.
- **1508 - ආපදා කළමනාකරණය** සඳහා 2022 වර්ෂයේ මෙන්ම 2023 වර්ෂය සඳහා ද රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00) ක මුදලක් වෙන් කර ඇත.

7. මීළඟ ප්‍රධාන වැය විෂය වන අංක 1600 විවිධ ගෙවීම් යටතේ 2022 වර්ෂයේ දී රුපියල් පන්ලක්ෂ අනූ අට දහසක (රු. 598,000.00) වියදමක් වෙන් කර ඇත.2022.09.30 දින වනවිට රුපියල් දෙලක්ෂ හයදහස් හාරසිය අනූ හයක (රු. 206,496.00) වියදමක් දරා ඇත. 2023 වර්ෂය සඳහා එය රුපියල් අට ලක්ෂ පනස් දහස (රු. 850,000.00) දක්වා වැඩි කර ඇත.

ඉහත ශීර්ෂය වෙන් වෙන් වශයෙන් මෙලෙස විග්‍රහ කරමි.

- **1601 - රැස්වීම් ගෙවීම්** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් එක්ලක්ෂ පනස් දහස ( රු. 150,000.00) මුදලක් වෙන් කර ලද අතර, ඉන් රුපියල් එක්ලක්ෂ දාහතර දහසක (රු. 114,000.00) මුදලක් මේ වන විට වැය වී ඇත. 2023 වර්ෂයට රුපියල් හාරලක්ෂ අටදහසක (රු. 408,000.00) මුදලක් වෙන් කර ඇත.
- **1602- මුදල් පරිහරණය** ගෙවීම් මෙම මුදල අප ආයතනය මුදල් ගනුදෙනු සිදු කරන නිලධාරියාට වෙන්කර ඇති අතර එම මුදලේ වෙනසක් සිදු වන්නේ නැත. එම මුදල රුපියල් 12,000 කි. මසකට රුපියල් දහස (රු. 1000.00) බැගින් ගෙවීම් සිදු කරනු ලබයි ( චක්‍රලේඛ විධිවිධාන අනුව)
- **1604 -පුහුණු කිරීමේ ගෙවීම්** වැය ශීර්ෂය සඳහා 2022 වර්ෂයේ දී රුපියල් පනස් දහසක (රු. 50,000.00) මුදලක් වෙන් කළ අතර, එම මුදල එලෙසම 2023 වර්ෂය සඳහා ද වෙන් කර ඇත.
- **1605 - මදුරු හා කෘමි පාලනකිරීමේ** වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේ දී රුපියල් ලක්ෂයක (රු. 100,000.00) වෙන් කිරීමක් කළ අතර, 2022.09.30 වන විට රුපියල් හතලිස් නමදහස් නමසිය විසි පහක (රු. 49,925.00) මුදලක් වැය කර තිබිනි. 2023 වර්ෂය සඳහා එය රුපියල් එක්ලක්ෂ පනස් දහස (රු. 150,000.00) දක්වා වැඩි කර ඇත.
- **1606 - අයකරගැනීමේ දිරි ගැන්වීමේ දීමනා** ගෙවීම් වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂයේදී රුපියල් එක්ලක්ෂ පහළොස් දහසක (රු. 115,000.00) මුදලක් වෙන් කර තිබුනි. මෙම මුදල ප්‍රාදේශීය සභාවේ ආදායම් නිලධාරීන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාවකි. 2023 වර්ෂයේදී එම මුදල ලක්ෂය දක්වා අඩු කර ඇත.

- **1609- පරිවර්තනය කිරීමේ ගාස්තු** 2022 වර්ෂයේදී රුපියල් දස දහස (රු. 10,000.00) මුදලක් වෙන් කර ඇති අතර, මේ වනතුරු එම මුදල වියදම් වී නොමැත. එයට හේතුව භාෂා පරිවර්පන කටයුතු වර්ෂයේ අවසන් මාස තුල සිදු කිරීමයි. 2023 වර්ෂයට එය රුපියල් විසි දහස (රු. 20,000.00) දක්වා වැඩි කර ඇත.
- **1610 - යන්ත්‍ර ක්‍රියා කරන්නන් සඳහා ගෙවීම්** වැය ශීර්ෂය තුලින් 2022 වර්ෂයේ දී රුපියල් හැට දහසක් (රු. 60,000.00) අයවැය ට ඇතුලත් කළ අතර, 2022.09.30 වන විට ඉන් රුපියල් දහනව දහස් පන්සිය

හතක (රු. 19,507.00) මුදලක් ගෙවා ඇත. 2023 වර්ෂය සඳහා ද එම මුදලෙහි වෙනසක් සිදු කර නොමැත.

- **1611 - ඉන්ජිනේරු උපදේශනාත්මක සේවා යටතේ** 2022 වර්ෂය සඳහා රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදලක් වෙන් කළ අතර, එම මුදල 2023 වර්ෂයේදී පනස් දහස (රු. 50,000.00) දක්වා අඩු කර ඇත.
- **1612 - නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීම** වැය ශීර්ෂය සඳහා 2023 වර්ෂයේදී වෙන් කිරීමක් සිදු කර නොමැත.

8. මීලග ප්‍රධාන වැය විෂය ලෙස අංක 1700 වෙනත් ගෙවීම් යටතේ 2022 වර්ෂයේ දී රුපියල් නම දහස ( රු. 9000.00 ) ක මුදලක් වෙන් කළ අතර, 2023 වර්ෂයේ දී ද එම මුදලෙහි වෙනසක් සිදු කර නොමැත.
    - **1701 - වරිපනම් මත වට්ටම්** සඳහා රුපියල් දහස (රු. 1,000.00) ක්
    - 1704 - හානි වූ හා යල්පිනු තොග ලියා හැරීම සඳහා රුපියල් පන්දහස (රු. 5,000.00) ක්
    - 1706 - බැංකු ගාස්තු සඳහා රුපියල් දෙදහස (රු. 2,000.00) ක්
    - 1707 - පුස්තකාල පොත් අගය ලියා හැරීම සඳහා රුපියල් දහස (රු. 1,000.00) ක් ලෙස මෙම අනු විෂයන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.
9. මීලග ප්‍රධාන වැය විෂය ලෙස අංක 1800 - ක්ෂය කිරීම් දක්වා ඇත. 2022 වර්ෂයේදී රුපියල් අසූ හතරලක්ෂ අනු දෙදහස් හාරසිය පනස් පහ (රු. 8,492,455.00) ක ක්ෂය කිරීම් ප්‍රතිපාදනයක් වෙන් කර ඇත. 2023 වර්ෂය සඳහා ලබා දී ඇති ක්ෂය කිරීමේ අනුපාතයන්ට අනුව රුපියල් එක්කෝටි අටලක්ෂ හැත්තෑ හතර දහස් දෙසිය අට (රු. 10,874,208.00) ලෙස දක්වා ඇත. මෙම වැය විෂය යටතේ ප්‍රාදේශීය සභා නව රීති ප්‍රකාරව ක්ෂය කිරීම් ගණනය කර ඇති බව ගරු සභාවට දන්වා සිටිනවා. ඒ අනුව අයවැය විෂය අංක 1801 සිට 1811 දක්වා පෙන්වා දී ඇති පරිදි ක්ෂය කිරීම් සිදු වී ඇත.
10. මීලඟ ප්‍රධාන වැය විෂය වන අංක 1850 - ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත අලාභ සඳහා 2022 වර්ෂයට රුපියල් එක්ලක්ෂ හැත්තෑ දහස (රු. 170,000.00) ක මුදලක් වෙන් කර තිබෙනවා. 2023 වර්ෂය සඳහා එය රුපියල් තිස් දහස (රු. 30,000.00) දක්වා අඩු කර ඇත. එය වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.
    - අංක **1854 - යන්ත්‍ර ඉවත් කිරීමේ අලාභ** රුපියල් දස දහස (රු. 10,000.00) කි
    - අංක **1857 - කාර්යාලීය උපකරණ ඉවත් කිරීමේ අලාභ** රුපියල් දස දහස (රු. 10,000.00) කි.
    - අංක **1858 - ලී බඩු ඉවත් කිරීමේ අලාභ** රුපියල් දස දහස (රු. 10,000.00) කි.
11. තවද ප්‍රධාන වැය විෂයයක් ලෙස අවසාන වැය විෂය ලෙස ද අංක 1900 - මූල්‍ය පිරිවැය සඳහා 2022 වර්ෂයේදී රුපියල් නම ලක්ෂ පනස් තුන් දහස් හයසිය දහය (රු. 953,610.00) ක මුදලක් වෙන් කර ඇත. 2023 වර්ෂය සඳහා එය රුපියල් හාර ලක්ෂ හැත්තෑ හය දහස් හාරසිය පහ (රු. 476,405.00) දක්වා අඩු වී ඇත. එයට හේතුව ලබා ගත් ණය මුදල 2023 ජුනි මාසයෙන් අවසන් වීමයි.

➢ මේ ආකාරයෙන් විග්‍රහ කරන ලද වියදම් අප විසින් වැඩසටහන් පහක් (5) ක් ඔස්සේ වියදම් කරනු ලබන අතර,

i. වැඩසටහන් අංක 01 පොදු පරිපාලනය සඳහා මුළු වියදම රුපියල් තුන්කෝටි හතලිස් අට ලක්ෂ විසිතුන් දහස් හත්සිය අනූපහ (රු.34,823,795.00) කි.
ii. වැඩසටහන් අංක 02 සේවා සහ බදු ලංකාව පුරාම ක්‍රියාත්මක නොවන වැඩසටහනක් බැවින් එම වැඩසටහන සඳහා වෙන් කිරීමක් සිදුකර නැත.
iii. වැඩසටහන් අංක 03 සෞඛ්‍ය සේවා සඳහා මුළු වියදම රුපියල් එක්කෝටි පන්ලක්ෂ හයදහස් අටසිය අසූ පහ (රු. 10,506,885.00) කි.
iv. වැඩසටහන් අංක 04 සඳහා වෙන් කරන ලද මුලු වියදම රුපියල් දෙකෝටි හැත්තෑඑක් ලක්ෂ දාහත් දහස් විසි හතර (රු. 27,117,024.00) කි.
v. වැඩසටහන් අංක 05 ක්‍රියාත්මක නොකරයි.
vi. වැඩසහන් අංක 06 මහජන උපයෝගිතා සේවා සඳහා වෙන් කරන ලද මුළු වියදම රුපියල් හැත්තෑ එක් ලක්ෂ හැට එක් දහස් තුන්සිය අට (රු. 7,161,308.00) කි.
vii. වැඩසටහන් අංක 07 සුභසාධක සඳහා රුපියල් අනූ අට ලක්ෂ හැට හත්දහස් හත්සිය පනස් නවය(රු. 9,867,759.00) ක් වෙන් කර ඇත.
viii. වැඩසටහන් අංක 08 ක්‍රියාත්මක නො කරයි.

➢ ඒ අනුව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම හත් කෝටි අසූහය ලක්ෂ දෙදහස් පන්සිය හැටතුන (රු. 78,602,563.00) කි.

➢ 2022 වර්ෂය සඳහා ස්වයං උත්පාදිත අතිරික්තය රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂ හැට නව දහස් හයසිය අසූ නවය (රු. 12,569,689.00) කි.

➢ මෙම අතිරික්ත මුදල සැකිල්ලට ගෙන සහා අරමුදල් ප්‍රාග්ධන වියදම් වර්ගීකරණයක් සිදු කර ඇති අතර, පහත එය විශ්ලේෂණය කරමි. (LG15/10)

- කොට්ඨාශයකට ලක්ෂ 05 බැගින් මාර්ග සංවර්ධනය කිරීම. (රු.6,000,000.00)

- ස්වයං රැකියා ලාභීන්ට වෙළඳකුටි ලබා දීම හා දැනට ක්‍රියාත්මක ස්වයං රැකියා ප්‍රවර්ධනය(රු.1,500,000.00)
- ගොවිපළක්, කොම්පෝස්ට් අංගනයක් සකස් කිරීම හා පැලතවානක් පවත්වාගෙන යාම.(රු.2,000,000.00)
- පානීය ජලය බෝතල් කර බෙදාහැරීම.(රු.2,000,000.00)
- සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවතුම්පල වල් සකස් කිරීම. (රු.500000.00)
- 239 ඥාණිකුළම ශ්‍රමදාන මාවතේ ප්‍රජාශාලාව අළුත්වැඩියා කිරීම.(රු.500,000.00)
- බල ප්‍රදේශයේ මාර්ගවල ප්‍රවාහනය කළ හැකි බර දක්වා දැන්වීම් ගැසීම

**<u>මධ්‍යම රජයේ හා පළාත් සභා අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති - 2023 (පුනරාවර්ථන නොවන වියදම් සඳහා ප්‍රදාන)</u>**

1. 247 වන්නියම්කුළම කම්කරු මාවත පිළිසකර කිරීම (රු.1000,000.00)
2. 247 වන්නියම්කුළම මාටින් වික්‍රමසිංහ මාවත බෝක්කු සමඟ කාණුපද්ධතිය සකස් කිරීම. (රු.1,500,000.00)
3. වගා ළිං ලබා දී ගොවිතැන් ශක්තිමත් කිරීම. (රු.1,500,000.00)
4. දිළිඳු පවුල් සඳහා සනීපාරක්ෂන කටයුතු සැකසීම. (රු.2,000,000.00)
5. පොතානේගම තිස්ස මාවත සංවර්ධනය (රු.2,000,000.00)
6. පොතානේගම විශාකා මාවත පිලිසකර කිරීම (රු.1,000,000.00)
7. නෙළුම්කන්නිය ගමට කෘෂි මාර්ගයක් සකස් කිරීම (රු.1,000,000.00)
8. 242 වන්නියම්කුළම ධර්මපාල මාවත, විද්‍යාල මාවත අතර අතුරු මාර්ගය අළුත්වැඩියා කිරීම (රු.500,000.00)
9. 275 කවරක්කුලම කුඩා වැව ප්‍රධාන මාර්ගය ඉදිරිපිට කොටස සංවර්ධනය කර ආකර්ෂණීය වෙළඳ කුටි ඉදි කිරීම. (රු.5,000,000.00)
10. 247 වන්නියම්කුළම සේවා පියස ඉදිරි වැඩ නිම කිරීම. (රු.1,000,000.00)
11. 247 වන්නියම්කුළම කොට්ඨාස 04හි කාණු පද්ධතිය සකස් කිරීම (රු.2,000,000.00)
12. 246 වන්නියම්කුළම සමිති ශාලාවේ වහලය සකස් කිරීම. (රු.1,000,000.00)
13. සූරිය බලයෙන් ක්‍රියාත්මක වන වීථි ලාම්පු සවි කිරීම ( රු.1,000,000.00)
14. 237 උණගස්වැව ප්‍රජා ශාලාව පිළිසකර කිරීම (රු.1,000,000.00)
15. 237 ඉත්තෑව ප්‍රජා ශාලාව සකස් කිරීම (රු.1,000,000.00)
16. මොරගොඩ තුරුළිය සෙවන හෙළ බොජුන් හලක් ස්ථාපිත කිරීම (රු.3,000,000.00)
17. 246 වන්නියම්කුළම අනුලා දේවි මාවත මීටර් 750 ක් සකස් කිරීම. (රු.1,500,000.00)
18. 258 පොතානේගම කොට්ඨාශයේ යෝධ ඇළ පාලම අසල භූමියේ පූජා නගරයට පැමිණෙන බැතිමතුන් සඳහා එළිමහනේ විවේක ගන්නා ස්ථානයක් ලෙස වැසිකිළි පද්ධතියක් පද්ධතියක් සමඟ සංවර්ධනය කිරීම හා එම ස්ථානයේ ජංගම වෙළඳ කුටි ඇති කිරීම. (රු.3,000,000.00)
19. නිදන්ගල මාවත කොන්ක්‍රීට් කිරීම (රු.2,000,000.00)
20. 270 සේවා පියස ඉතිරි වැඩ නිමකිරීම (රු.1,000,000.00)
21. 270 තුලාන කෘෂි මාර්ගය ඉදි කිරීම (රු.1,000,000.00)
22. 271 කෘෂි මාර්ගය ඉතිරි කොටස නිම කිරීම (රු.1,000,000.00)
23. 267 දෙහි අත්ත මාර්ගය සංවර්ධනය (රු.1,000,000.00)
24. සේනානායක මාවත ඉතිරි කොටස තාර දැමීම. (රු.2,000,000.00)
25. ගජබා මාවත මුල් කොටස තාර දැමීම (රු.2,000,000.00)
26. 279අරුණගම අජිත් මහතාගේ නිවස පාර සකස් කිරීම (රු.500,000)
27. 279 කලත්තෑව කෘෂි මාර්ගය ඉදි කිරීම (රු.2,000,000.00)
28. 237 මහ පාලාඩිකුල හා වේලුවනගම ප්‍රජා ශාලා සකස් කිරීම (රු.2,000,000.00

- මෙහි දී මා හට මෙම අයවැය ලේඛනය සැකසීම සඳහා තොරතුරු හා යෝජනා ලැබුණු අතර අවසාන අවස්ථාවේ දීත් ඔබ විසින් ඉදිරිපත් කර ඇති යෝජනා ඇතුළත් කිරීමටත් නව සංශෝධන ඇතුළත් කිරීමටත් එකඟ වෙමින් 2023 අයවැය කථාව මින් හමාර කරමින් ඔබතුමාලා තුමියන්ලා වෙත මෙම අයවැය සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඒකමතිකව සහා සම්මත කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙමින් අයවැය යෝජනාව ඉදිරිපත් කිරීම අවසන් කරමි.සියළු දෙනාට අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ පිහිට පතමි.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> 2023 වර්ෂයේ අයවැයට අදාළ ව ප්‍රාදේශීය සභාවක් ලෙස ඉදිරි වර්ෂය සඳහා සංවර්ධන සේවාවන් පවත්වා ගෙන යන්නේ කෙසේ ද යනුවෙන් විමසන ලදි. මන් ද පොදු ජනතාව වෙනුවෙන් ලැබීමට නියමිත ප්‍රතිපාදන වල බොහෝ කප්පාදුවක් පවතින බවත්, සමහර ප්‍රතිපාදන වලින් ඉදිරි වසර සඳහා භාගයක් කප්පාදු කර ඇති අතර සමහර ප්‍රතිපාදන මුළුමනින් ම කප්පාදු කර ඇති බවත්, එහි දී මූලිකව ම ජනතාව ප්‍රාදේශීය සභාවක් තුළින් බලාපොරොත්තු වන සේවාවන් කප්පාදුවක් සිදු වී පවතින බවත්

ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම අයවැය යෝජනාවට අනුව 237 තුලාන සඳහා ප්‍රජා ශාලා තුනක් ම ඉදි කිරීමට යෝජනා කර ඇති බවත්,ඒ පිළිබඳ ව සොයා බැලිය යුතු බවත් පවසන ලදී.

කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිරි වසර සඳහා ආදායම් උත්පාදනයක් ඇතුළත් කර නොමැති අතර ගිය වසරේ ද කිසිදු ආදායමක් ලැබී නොමැති බවට මෙහි සඳහන් වී පවතින බවත්, කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ හිස් ගොඩනැඟිලි පවතින බවට මීට පෙර අවස්ථා වල දී තමා ප්‍රකාශ කර ඇතත් ඒවා වාර්තාගත වී නොමැති බවත් ආර්ථික මධ්‍යස්ථානය වසා තිබෙන බවත් පවසන ලදී. මෙම අය-වැය තුළින් ඉලක්කම් ඇතුළත් කර විජ්ජාවක් සිදු කර ඇති බවත්, ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඉටු කරන බොහෝ සේවාවන් කප්පාදු කර ඇති බවත්, ජනතාවගෙන් බදු අය කර ගන්නේ නම් ඔවුන්ට සතුටුදායක සේවාවක් ලබා දීම සිදු කළ යුතු බවත්, නමුත් මෙහි දී සිදු වී ඇත්තේ ගිය වසරේ සේ ම අනෙක් වියදම් ඒ ආකාරයෙන් පවතින විට ජනතාවගේ සුබ සාධනය උදෙසා අවශ්‍ය සේවාවන් කප්පාදු කිරීම බවත්, මේ තුළින් ප්‍රාදේශීය සභාව පිළිබඳ ව ජනතාව තුළ ඇති විශ්වාසය බිඳ වැටෙන බවත්, තමන් මේ නිසා මෙම අය වැය ට විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, ඊළඟ වසරේ දී අලුත් නායකත්වයකින් ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කරන අයවැයක් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය මෙම 2023 අයවැය ඉතා සාර්ථක අයවැයක් බවත්, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව කිසි දිනෙක ජනතාව අමතක කර ගමනක් පැමිණ නොමැති බවත් , මෙම අය-වැය තුළින් ද ජනතාවගේ සුබසාධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර පවතින බවත්, වර්තමානයේ ද අප ප්‍රාදේශීය සභාව ජනතාව වෙනුවෙන් බොහෝ සුබසාධන සේවා පවත්වා ඇති බවත් , එම සුබසාධන සේවාවන් සියලුම කොට්ඨාශ නියෝජනය වන පරිදි සිදු කර ඇති බවත්, එහි දී සෞඛ්‍ය සඳහා ඩෙංගු මර්දන වැඩසටහන්, බෝ නොවන රෝග සහ ලිංගික අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන්, එහි දී ස්වෙච්ඡාවෙන් ම බොහෝ වෛද්‍යවරුන් ප්‍රමාණයක් සහභාගි වී සෞඛ්‍ය සායන ආදී පැවැත්වූ බවත්,නව ව්‍යාපාරිකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය බතික් පුහුණු ආදී වැඩසටහන් ද , ශිෂ්‍යත්ව දරුවන් උදෙසා ශිෂ්‍යත්ව වැඩසටහන් ද, ගෙවතු වගා වැඩසටහන් බොහොමයක් සිදු කර ඇති බවත්, රටේ ආර්ථික තත්ත්වය අස්ථාවර ව පවතින අවස්ථාවල දී පවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව මහජනතාව අමතක නොකර ඔවුන් වෙනුවෙන් සුබසාධන සේවා ඉටු කළ බවත්, ප්‍රකාශ කරන ලදී.

එම නිසා මෙම 2023 අයවැය අශුභවාදී ලෙස දැකීම නුසුදුසු බවත්, 2023 වසරේ දී අපට බොහෝ සංවර්ධන වැඩ කොටසක් ඉටු කිරීමට පවතින බවත්, ඒ සඳහා තිරසාර සංවර්ධන ව්‍යාපෘති, පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා සිදු කරන ව්‍යාපෘති ආදිය මඟින් බොහෝ ප්‍රතිපාදන ලැබෙන බවත් පවසන අතර, මේ වසරේ දී මුල් වරට අප ප්‍රාදේශීය සභාවේ කාන්තා කමිටුවක් පත් වී පීඩාවට පත් කාන්තාවන්ට සේවාවන් සැපයූ බවත්, එහි දී නීතිඥවරුන් මාර්ගයෙන් ගෘහස්ථ හිංසනයට පත් වූ කාන්තාවන්ට හා නිලධාරීන්ගේ හිංසනයට ලක් වූ කාන්තාවන්ට සේවාවන් සැපයූ බවත්, ඉදිරියේ දී නීති සහන සේවාවක් පැවැත්වීමටත් අරමුණු කර ඇති බවත්, මේ සඳහා මන්ත්‍රීවරු සියලුම දෙනාගේ සහයෝගය ලැබුණු බවත් , ඒ අනුව 2023 වර්ෂයේ අයවැය තුළින් ආර්ථිකය ඉහල නැංවීම සඳහා විශාල වැඩ පිළිවෙළක් යොදා ඇති බවත් , මෙය ධනාත්මකව පවතින අයවැයක් නිසාත් මෙම අයවැය සුදුසු ඉතා සාර්ථක අයවැයක් බවට ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා 2023 වර්ෂය සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව ඉදිරිපත් කර තිබෙන මෙම අයවැය ඉතා සාධනීය අයවැයක් බවත්, මේ තුළින් ජනතාවගේ සුභ සිද්ධිය පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කර ඇති බවත් පවසන ලදී. වර්තමාන ගරු සභාපතිතුමා සභාපති ලෙස කටයුතු සිදු කරන ලද මෙම වසර 5 තුළ දී ඉතා හිතකර සේවාවක් ජනතාව වෙනුවෙන් ඉටු කළ බවත්, රටේ පැවැති වසංගත කාලයේ දී ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කාර්ය මණ්ඩලය සමග එක් වී කටයුතු කළ බවත්,ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රී තුමියන්ලා ද සහය දැක්වූ බවත් පවසන ලදී.

මෙම අවස්ථාවේ දී අරමුණ විය යුත්තේ ආණ්ඩු මාරු කිරීම නොවන බවත් වර්තමානයේ රට පවතින තත්ත්වයෙන් ගොඩ ගැනීම බවත්, ඉන්දියාවේ විපක්ෂය එම රට අස්ථාවර ව පවතින අවස්ථාවේ ප්‍රකාශ කළේ, පදනම් විරහිතව රට ගොඩ ගැනීමට උදව් කළ යුතු බව වුවත් ශ්‍රී ලංකාවේ එම අවස්ථාවේ දී සිදු කරන ලද්දේ වර්ජන සිදු කර රට තවත් අස්ථාවරත්වයට පත් කිරීම බවත් ප්‍රකාශ කරන ලදී. එම නිසා 2023 වර්ෂයෙන් නැගෙනහිර නුවරගම් පළාත අප ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කර ඇති මෙම සාධනීය අයවැය ඉතා

සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා සියලුම දෙනා එකට එක් වී මේ සඳහා සහාය දිය යුතු බවත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> 2023 වර්ෂය සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරන ලද අය වැය ඉතා සාධනීය අයවැයක් වශයෙන් පෙන්වා දිය හැකි බවත්, මෙම අයවැය සෑදීමට ප්‍රථම ව ගරු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ගරු මන්ත්‍රීතුමාන්ලාගේ හා නිලධාරි මණ්ඩලයෙන් ද සහාය ඇති ව ජනතාව නියෝජනය වන පරිදි ප්‍රජා නායකයින් ගෙන්වා ඔවුන්ගෙන් අදහස් ලබාගෙන මෙය සකස් කළ බවත්, එහි දී සියලුම මන්ත්‍රීවරුන් සඳහා මෙම වැඩසටහන්වලට ආරාධනා කළ නමුත් ජනතාව පිළිබඳ හැඟීමක් නැති මන්ත්‍රීවරුන් මේ සඳහා සම්බන්ධ නොවුණු බවත් පවසන ලදි.

ඒ අනුව 2023 වර්ෂයේ මෙම අයවැය තුළ ජනතාවගේ අදහස් අන්තර්ගත කරමින් , කුඹියාගේ හැටියට කැවුත්ත කියන්නා සේ කළ හැකි දේ ඉතා සාර්ථකව ඉදිරිපත් කර ඇති බවත් , එහි දී ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප ලබා දුන් සේවාවන් මොනවා ද අප ලබා දිය යුතු සේවාවන් මොනවා ද යනුවෙන් ඉතා හොඳ අවබෝධයකින් යුතු ව නව ලේකම් තුමාගේ හා නිලධාරීන් මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් මෙය සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ආහාර සුරක්ෂිතතාවය සඳහා සිදු ක ළයුතු වැඩපිළිවෙල පිළිබඳ ව මෙම අයවැය තුළ විශේෂ අවධානයක් යොමු කර තිබීම ඉතා වටිනා බවත්, එමෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා මෙම අය-වැය තුළින් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති බවත් ඒ අනුව ගරු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් එම සේවාවන් ඉටු කිරීම සඳහා අප සියලු දෙනා එකට එක් වී සහාය දිය යුතු බවත් ප්‍රකාශ කරමින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අය වැය ඉතා සාධනීය මෙන්ම ජනතාවට ද සුබ දායි අයවැයක් බව පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ඉතා හොඳ අයවැයක් බවත්, 2022 වර්ෂයේ දී රටේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය හා රටේ පැවති අරගල තත්වය හමුවේ ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප සභාවට ද ලබාගත යුතු ආදායම් ලබා ගැනීමේ ගැටලුවක් ඇති වූ බවත් , නමුත් 2023 වර්ෂයේ දී සැලකිය යුතු ආදායමක් ලබා ගැනීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම අයවැය තුළ තුරුලිය සෙවන නිවාඩු නිකේතනය ඇතුළත් කරමින් සංවර්ධනය කිරීමට වැඩපිළිවෙළක් සකස් කිරීම ඉතා යෝග්‍ය බවත්, ජනතාවගේ සුභ සිද්ධිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම 2023 අය-වැය තුළින් සාර්ථකව සිදු කර ඇති බව හා එම ප්‍රතිපාදන වෙන් කිරීම ප්‍රමාණවත් බවත් , පසුගිය කාලයේ රටේ පැවැති ආර්ථික අස්ථාවරත්වය හමුවේ ද ප්‍රාදේශීය සභාවක් ලෙස, බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කිරීම හා පානීය ජල පහසුකම් ලබාදීම ආදී කටයුතු නො අඩුව සිදු කරමින් ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කළ බවත් පවසන ලදි.
ආහාර සුරක්ෂිතතාවය සඳහා 2023 අයවැය තුළ ඇතුළත් කර තිබෙන වැඩපිළිවෙළ ඉතා යෝග්‍ය බව හා මෙම අය-වැය තුළින් ඉදිරි වැඩ කටයුතු සිදු කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ට සියලු දෙනා එක් වී සහාය දිය යුතු බවත්, නමුත් අනාගතයේ රටේ තත්ත්වය පිළිබඳ ව ස්ථිරව ම ප්‍රකාශ කළ නො හැකි බවත් ප්‍රකාශ කරමින් 2023 වර්ෂය සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරන ලද අය අයවැය සුදුසු අයවැයක් ලෙස පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා</u> වර්තමානයේ දී ශ්‍රී ලංකාව දැඩි ආර්ථික අවපාතයකට ලක් වී ඇති බවත්, ගරු සභාපතිතුමා මේ තත්ත්වය පිළිගැනීම ගැන තමා සතුටු වන බවත්, අයවැය සාකච්ඡාවේ දී සිදු කළ බොහෝ කතාවලින් පැවසුවේ රටේ ආර්ථික අස්ථාවරත්වයට අරගලය හේතු වූ බව වුවත් අරගලයට හේතු වූයේ ගොවියාට පොහොර දෙන්නම් යනුවෙන් පවසා පොහොර නො දී පාරට ඇද දැමීම බව, තෙල් පෝලිම් ඇති කිරීම හා ශ්‍රී ලංකාවට ඩොලර් ලැබෙන මාර්ග වසා දැමීම වැනි කටයුතු නිසා බව පවසන ලදී. ශ්‍රී ලංකාවට ඩොලර් ලබාගැනීමේ ක්‍රම බොහොමයක් පවතින බවත් එහි දී මානව සම්පත නිසි ලෙස කළමනාකරණය කරමින් අවශ්‍ය වෘත්තීය දැනුම හා අධ්‍යාපන ලබා දී රටේ බුද්ධිමත් පිරිස විදේශ රැකියා වෙත යොමු කර ඩොලර් ලබාගත හැකි බවත් , නාසා ආයතනයේ ද බහුතරයක් ශ්‍රී ලාංකික විද්‍යාඥයින් පිරිසක් සේවය කරන බවත්, නමුත් අඩු වැටුපට විදේශ ගෘහ සේවය සඳහා බොහෝ පිරිසක් වර්තමානයේ යොමු කර ඇති බවත් පසුගිය පැවති ආණ්ඩු මෙලෙස විදේශ විනිමය නිසියාකාරව ලබා ගැනීම සඳහා කටයුතු සිදු කර

නොමැති බවත්, එමෙන්ම ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත තුළින්ද විදේශ විනිමය උපයා ගැනීමේ අවස්ථාවන් තිබෙන අතර ඒ සඳහා ද කටයුතු සිදු නො කරන බවත් ප්‍රකාශ කරන ලදි.

වර්තමානයේ රටේ ආර්ථික ස්ථාවරත්වය හමුවේ බොහෝ දරුවන් මන්ද පෝෂණයට ලක් වී ඇති බවත් මේ පිළිබඳ ව ලෝක සෞඛ්‍ය සංවිධානය පවා ප්‍රකාශ කර සිටින බවත්, 2023 වර්ෂය සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරන ලද අය වැය තුළ කාන්තාවන් සඳහා රුපියල් ලක්ෂ 5ක් පමණක් වෙන් කර ඇති අතර බල ප්‍රදේශයේ කාන්තාවන් ඉතා විශාල ප්‍රමාණයක් සිටින නිසා එය ප්‍රමාණවත් නොවන බවත් ඒ අනුව මෙම අය-වැය තුළින් කුඩා දරුවන්, කාන්තාවන්, තරුණයින් වැනි පිරිස් වෙත අවධානය යොමු නො කරමින් මෙම අයවැය සකස් කර ඇති බවත්, මෙම අයවැයට අනුව සූර්ය පැනල සවි කිරීම ව්‍යාපෘතිය තුළ එක වර්ග මීටරයක් සවි කිරීම සඳහා රුපියල් ලක්ෂයක පමණ මුදලක් වැය වන බවත් , මෙම අයවැයට අනුව සූර්ය පැනල් තුලින් මාසෙකට ලක්ෂ 5ක ආදායමක් ඉපයීම සඳහා සූර්ය පැනල් සවි කිරීමට කෝටි 8ක පමණ මුදලක් වැය කිරීමට සිදු වන බවත් , මෙම අයවැයට අනුව විශාල ආදායම් උත්පාදනයක් පෙන්නුව ද ශුද්ධ ආදායම ඉතා අඩුවෙන් තිබෙන බවත් මේ පිළිබඳව බ්ලොග් ගල් නිෂ්පාදනය ආශ්‍රයෙන් පෙනී යන බවත්,ඒ අනුව මෙම අයවැයේ අන්තර්ගත කරුණු යථාවාදී නොවන බවත් පවසන ලදි.

මෙම අයවැය ඉතා හොඳ අයවැයක් ලෙස ප්‍රකාශ කළත් මෙහි ප්‍රතිපාදන වෙන් වී තියෙන්නේ ග්‍රාම සේවා වසම් 34 ට සාධාරණ ලෙස නොවන බවත්, ස්වෙච්ඡා සංවිධාන නායකයින්ගේ අදහස් අනුව ම අයවැය සකස් කිරීමට නම් මන්ත්‍රීවරුන් අවශ්‍ය නොවන බවත්, ස්වෙච්ඡා සංවිධාන නායකයින්ගේ අදහස් ලබාගත යුතු වුවත් ඒවා සාධාරණ ලෙස හා පොදුවේ අන්තර්ගත කිරීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. 2023 වර්ෂය සඳහා වන අයවැය සංශෝධන සහිත ව නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන අතර, ආපදා කළමනාකරණය යටතේ වන අලි ගැටලුව ඉතා දරුණු පවතින නිසා ඒ පිළිබඳ ව අවධානය යොමු විය යුතු බවත්, අනාගතයේ දී ආහාර හිඟතාවයක් ඇතිවීමේ අවදානමක් පවතින නිසා ඒ වෙනුවෙන් ද කටයුතු කිරීම සුදුසු බවත් පවසන ලදි. මෙම අයවැය තුළ අන්තර්ගත කර තිබෙන වගා ළිං ඉදිකිරීම ඉතා හොඳ යෝජනාවක් වුවත් මේ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ඉදි කිරීමට හැකි වන්නේ වගා ළිං දෙකක් පමණක් බවත්, මෙම අයවැය තුළ ඉතා හොඳ ලක්ෂණයන් ද අන්තර්ගත වී පවතින බවත්, නමුත් ආදායම් උත්පාදනයේ දී ඒවා ප්‍රායෝගික ව ඉටු කර ගැනීමේ හැකියාව පවතිනවා ද යන ගැටලු සහගත බවත් , ඒ අනුව මෙම 2023 වර්ෂය සඳහා වන අය වැය ජනතාවාදී අයවැයක් ලෙස පිළිගත නො හැකි බවත්, මෙම අයවැය අනුමත කිරීම පිළිබඳ ව විරුද්ධ වන බවත් ප්‍රකාශ කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ අයවැය සකස් කිරීමේ දී බල ප්‍රදේශයේ සිටින ස්වේච්ඡා සංවිධාන නායකයින් ගේ අදහස් ලබාගෙන මේ සඳහා ඇතුළත් කර ඇති බවත්, එම වැඩසටහනට සහභාගී නොවී අයවැය සඳහා චෝදනා ඉදිරිපත් කිරීම නුසුදුසු බවත්, එහි දී බොහෝ අය වැය යෝජනා ඉදිරිපත් වූ අතර අයවැය සකස් කිරීමේ දී ගරු සභාපතිතුමා ලැබෙන ආදායමට අනුව වියදම් කිරීම සඳහා සුදුසු යෝජනා කොට්ඨාස 11 ම ආවරණය වන පරිදි ඉතා සාධාරණ ලෙස මේ සඳහා ඇතුළත් කර තිබෙන බවත්, ඒ අනුව 2023 වර්ෂය සඳහා වන මෙම අයවැය ඉතා සාධාරණ මෙන් ම සාධනීය අයවැයක් වශයෙන් ප්‍රකාශ කළ හැකි බවත් , මෙම අයවැය තුළ දිළිඳු පවුල් වෙනුවෙන්, ඔවුන්ගේ ස්වයං රැකියා කටයුතු වෙනුවෙන්, සනිපාරක්ෂක කටයුතු වෙනුවෙන්, සංවර්ධනයක් සිදු කිරීම සඳහා අඩි තාලමක් යොදා ඇති බවත්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය අඩු වුවත් එයින් සිදු කළ හැකි උපරිම සේවාවක් ඉටු කිරීම සඳහා ගරු සභාපතිතුමන් ඇතුළු ව සියලු දෙනා කටයුතු කරන බවත් , කෘෂිකාර්මික කටයුතු සඳහා ද මෙම අය-වැය තුළින් වඩා හොඳ ප්‍රතිපාදනයක් වෙන් වී ඇති බවත් එහි දී ගම්මිරිස් වගාව ඉතා යෝග්‍ය වැඩපිළිවෙළක් ලෙස හඳුන්වා දිය හැකි බවත් , අප ප්‍රාදේශීය සභාවට ලැබෙන මුදල් පිළිබඳ ව හොඳ අවධානයකින් මෙම අයවැය සකස් කර ඇති නිසා 2023 වර්ෂය සඳහා වන අයවැය සුදුසු අයවැයක් බවට ප්‍රකාශ කරන අතරම ඊළඟ වසර සඳහා ද මෙවැනි සාර්ථක අයවැයක් ඉදිරිපත් කිරීමට හැකි වේවා යැයි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> අයවැය කෙටුම්පත පිළිබඳ ව හොඳ සාකච්ඡාවක් පැවති බවත්, අයවැය සකස් කරන ලද්දේ සහභාගීත්ව සංවර්ධන සැලැස්මක් මත නම් තමා සභාපති ලෙස කටයුතු කරන කාලයේ දි මීට වඩා සාර්ථක තරඟකාරී ලෙස පැවැති සහභාගීත්ව සංවර්ධන සැලැස්මක් මත අයවැය යෝජනා ලබාගත් බව පවසන ලදී. බොරළු බලපත්‍රයක් ලබාගැනීමේ දී ප්‍රාදේශීය සභාව සඳහා ගාස්තු ගෙවීම අනිවාර්ය වුවත් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ එය සිදු නො වන්නේ ඇයි දැයි යනුවෙන් නව

ලේකම්වරයාගේ දැන ගැනීම සඳහා පවසන බවත්, නාච්චාදූව සති පොල සඳහා වර්තමානයේ ආදායම් අඩු වී පවතින අතර අයවැය යෝජනා සකස් කළ පාර්ශවයන් ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් නො කළේ කුමන හේතුවක් නිසා ද යනුවෙන් විමසන ලදි.

4305 යටතේ ප්‍රචාරක දැන්වීම් සඳහා ද බල ප්‍රදේශ වල තිබෙන ප්‍රචාරක දැන්වීම් වලින් ආදායම් නිවැරදිව ලැබෙනවා ද යනුවෙන් සොයා බැලිය යුතු බවත්, ප්‍රාදේශීය සභාවක් තුලින් ඉටුවිය යුත්තේ ජනතාවගෙන් බදු මුදල් අය කරගෙන එම බදු මුදල් වලින් ජනතාවට සේවය සැපයීම සඳහා බවත්, 4703 යටතේ ලක්ෂ 7 ක තැන්පතු ආදායමක් පෙන්වන අතර මේ සඳහා කොපමණ මුදලක් ස්ථාවර තැන්පතු වශයෙන් තැන්පත් කර තිබෙනවා ද යනුවෙන් විමසන ලදී. 4202 වැය අංක 2 යටතේ ගලි බවුසර ආදායම් යටතේ පසුගිය වසරේ දී සේවාව ඉටු කිරීමට නොහැකිව නැවත මුදල් ලබා දීම් සිදුකර ඇති බවත් මේ සඳහා අවධානය යොමු කර ගලි බැහැර කිරීම සඳහා නියමිත ස්ථානයක් ඉඩමකින් හෝ ලබාගෙන සකස් කළ යුතු බවත්, එහිදී ප්‍රාදේශීය සභාවට ඉහළ ආදායමක් ලබාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. 4901 යටතේ පසුගිය වසරේ දී කොම්පෝස්ට් ව්‍යාපෘතිය යටතේ ආදායම් ඉපයීමක් සිදු වී නොමැති බව පවසන අතර අනවසර ඉදිකිරීම් පිළිබඳව රාජකාරි කටයුතු සිදු කිරීමේදී දුප්පත් අහිංසක ජනතාව පිළිබඳව සිතා මානුෂීයව කටයුතු කරන නිලධාරීන් යෙදවීම සුදුසු බවත් මෙය ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ටද බලපාන ගැටලුවක් බවත්, ප්‍රකාශ කරන ලදී. බ්ලොග් ගල් නිෂ්පාදනයේදී රුපියල් ලක්ෂ 70 ක ආදායමක් පෙන්වන අතර දිනකට බ්ලොග් ගල් විසිනවයක් සෑදුවත් ඒ සඳහා මෙහි ලක්ෂ 63 ක වියදමක් පෙන්වන අතර, සේවක වැටුප් ගෙවීම, විදුලිය, කළමනාකරු සඳහා , ජලය , මුරකරු ආදී ගෙවීම් සිදු කළ පසුව මෙහි ලාභයක් තිබේ ද යනුවෙන් ගැටලු සහගත බවත් මේ සඳහා අවධානය යොමු කළ යුතු බවත් පවසන ලදි.

ප්‍රාදේශීය සභාව සතුව තණකොළ කැපීම සඳහා විශාල යන්ත්‍රයක් මිලදී ගෙන ඇති අතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටිවල තණකොළ කැපීම සිදු කරන්නේ නගර සභාව සතු තණකොළ කපන යන්ත්‍රයට මුදල් ගෙවීමක් සිදු කරමින් බවත් , බල ප්‍රදේශයේ ක්‍රීඩාපිටි සභාව සතු වන නිසා මෙවායේ තණකොළ කැපීමට අවම වශයෙන් ඩීසල් සඳහා වන වියදමක් හෝ ලබාගෙන මෙම කාර්යය සිදු කර දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ පත්තර මිලට සාපේක්ෂව පත්තර සඳහා ලැබෙන ආදායම පිළිබඳව ද සැලකිලිමත් විය යුතු බවත්, 4103 විශය අංක යටතේ ළමා උද්‍යානයේ සෙවන සඳහා වන වැඩපිළිවෙළක් සෑදීම සුදුසු බවත් එම ළමා උද්‍යානය සකස් කරන ලද්දේ මුදල් වංචා කිරීමේ අරමුණෙන් බවත් , 4402 පෙර පාසල් යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතුව තමා දන්නා තරමින් නියමානුකූල පෙර පාසලක් නොමැති බවත්, එක් පෙර පාසලක් සඳහා විශේෂ සැලකිලි දැක්වීම බල ප්‍රදේශයේ අනික් පෙර පාසල් සඳහා ගැටලුවක් විය හැකි බවත්, 2023 අයවැය කෙටුම්පතට අනුව ව්‍යාපෘති විසි අටක් සිදු කිරීම සඳහා ඉදිරිපත් කළ ඇති නමුත්, මෙහි අන්තර්ගත ව්‍යාපෘති අතරින් ප්‍රාදේශීය සභා පනතට අනුව 3,4 ,20,21,22,23 27 යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථාවක් නොමැති බවත්, හැකියාවක් තිබේ නම් එය සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

මෙම අයවැය කෙටුම්පතට අන්තර්ගත කර තිබෙන ජල ව්‍යාපෘතිය සඳහා පැහැදිලි ව්‍යාපෘති යෝජනාවක් සකස් කර මහා සභාව වෙත ඉදිරිපත් කර, අනුමත කර, එහි ආදායම සහ වියදම නියමානුකූල ව පෙන්වා දෙන ලෙසත්, සේවා මධ්‍යස්ථානය පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත්, පසුගිය වසරේ එයින් උපයන ලද ආදායම ඉතා අඩු බව හා ඒ සඳහා විශාල මුදලක් වැය කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාවක සභාපති ධූරය උසුලන ලද පුද්ගලයා කාලයෙන් කාලයට වෙනස් වන බවත්, සිංහයෙකුගේ අගය තේරීමට බූරුවෙක් රජ විය යුතු බව ප්‍රකාශ කරන්නා සේ හිටිය සභාපති වරයකුගේ අගය තේරෙන්නේ නව සභාපතිවරයෙක් පත් වූ පසුව බවත්, වර්තමානයේ රට අස්ථාවරත්වයෙන් ගොඩ ගැනීමට කටයුතු සිදුකළ යුතු බවත්, මා ඕ සේතුං ප්‍රකාශ කළ ආකාරයට " මාළුවෙක් දෙනවා වෙනුවට බිලී පිත්තක් දුන්නා නම්" රට මේ තරම් ආර්ථික අවපාතයකට නොවැටෙන බවත් , ලෝකයේ දියුණු වූ අනිත් රටවල් සමඟ ගත් විට ශ්‍රී ලංකාව තවත් දියුණු වෙමින් පවතින රටක් බවත් , සිදුකල යුතු වන්නේ ජනතාවගේ සුභ සිද්ධිය සහ රටේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු සිදු කිරීම බවත් , දේශපාලනඥයින්ගේ පටු අරමුණු ඉටු කර ගැනීම සිදු නොකර ජනතාව වෙනුවෙන් සාධාරණ සේවයක් ඉටු කිරීම සුදුසු බවත්, ඒ අනුව 2023 වර්ෂය සඳහා වන මෙම අය වැය සම්මත කර ගැනීම සඳහා තමාගේ මනාපය ලබා දීමේ දී හෘද සාක්ෂියට එකඟ ව ලබා දීම සුදුසු බවත්, එසේ නොමැති නම් සංශෝධන සහිත නව අයවැයක් ඉදිරිපත් කරනවා ද යන්න තීරණය කළ යුතු බවත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**03. සංශෝධිත අයවැය කෙටුම්පත මහ සභා සම්මත කර ගැනීම**

**ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා** අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ට හා මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිය ප්‍රකාශ කරන ලදි. ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා 2023 අයවැය තුළ විශාල වැඩපිළිවෙළක් යොදා තිබෙන අතර එසේ නොමැති බව ප්‍රකාශ කිරීම පිළිබඳ ව තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත්, පළාත් පාලන ආයතනයක් ලෙස අපට ලබා දී තිබෙන බලතල අනුව ජනතාව වෙනුවෙන් මේ වන විට විශාල සේවාවක් ඉටු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී . මෙහි දී කාන්තාවන් ,කුඩා දරුවන් වැනි මානව සම්පත සඳහා ද ප්‍රාදේශීය සභාවක් ලෙස හැකි අයුරින් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, ගරු කුමුදු මන්ත්‍රී තුමන් 2023 අයවැය කෙටුම්පතේ හොඳ පැතිකඩක් දැකීම යනුවෙන් පැවසීම සතුටට කරුණක් බවත්, ගරු බන්දුලසේන මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කරන ලද ළමා උද්‍යානයේ අවශ්‍ය ජලය ලබා දීම්, තණකොළ කපා එළි පෙහෙළි කිරීම් ආදී කටයුතු ප්‍රාදේශීය සභාව විසින් කිසිදු ගාස්තුවක් අය නොකර ඉටුකර දී ළමයින්ගේ සුබ සාධනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත්, පවසන ලදි.
එමෙන්ම ඉදිරිපත් කරන ලද අය වැය සංශෝධනයන්ට යටත්ව සියලු දෙනා ඒකමතිකව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි.

**ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා** 2023 අයවැය කෙටුම්පතට අදාළ ව අපගේ අදහස ඉදිරිපත් කළ අතර මෙය සම්මත කිරීම සඳහා බෙදීමක් අවශ්‍ය ලෙසට යෝජනා කරන ලදි.

**ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා** ඡන්ද විමසීමක් සිදු කිරීම සඳහා ලේකම් තුමා වෙත දැනුම් දෙන ලදි.

ඒ අනුව ලේකම් තුමා විසින් ඡන්ද විමසීම සිදු කරන අතර එම වාර්ථාව පහත පිරිදි වේ.

| | | | |
|---|---|---|---|
| **01.** ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | | පක්ෂ |
| **02.** ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | | | පක්ෂ |
| **03.** ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | | පක්ෂ |
| **04.** ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | | පක්ෂ |
| **05.** ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | | පක්ෂ |
| **06.** ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | | පක්ෂ |
| **07.** ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | | පක්ෂ |
| **08.** ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | | පක්ෂ |
| **09.** ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | | පක්ෂ |
| **10.** ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | | පක්ෂ |
| **11.** ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | | පක්ෂ |
| **12.** ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | | විරුද්ධ |
| **13.** ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | | විරුද්ධ |
| **14.** ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | | විරුද්ධ |
| **15.** ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | | විරුද්ධ |
| **16.** ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | | පක්ෂ |

ඒ අනුව පක්ෂ ව ඡන්ද 12 ක් හා විරුද්ධව ඡන්ද 4 ක් හිමි වූ අතර වැඩි ඡන්ද 8 කින් අයවැය කෙටුම්පත සභා සම්මත විය.

අනතුරුව මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ ගරු සභිකවරුන් සියලු දෙනා වෙත හා කාර්යය මණ්ඩලයේ සියලු දෙනා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම හා සම්මත කර ගැනීම වෙනුවෙන් පැවැත් වූ විශේෂ මහ සභා රැස්වීම ප.ව.01.30ට අවසන් කරන ලදි.

.....................................                                                                    ...........................................

ලේකම්,
නැ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

සභාපති ,
නැ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.